

# කාර්ය සාධන වාර්තාව
# செயலாற்றுகை அறிக்கை
# PERFORMANCE REPORT

# 2025


ආගමන හා විගමන දෙපාර්තමේන්තුව
குடிவரவு மற்றும் குடியகல்வுத் திணைக்களம்
Department of Immigration and Emigration
**ශ්‍රී ලංකාව** **இலங்கை** **SRI LANKA**

## ආගමන හා විගමන දෙපාර්තමේන්තුව

# කාර්ය සාධන වාර්තාව 2025

**වැය ශීර්ෂ අංක - 226**

ප්‍රතිපත්ති, සංවර්ධන හා ප්‍රතිසංස්කරණ අංශය

# ආගමන හා විගමන පාලක ජනරාල්ගේ පණිවිඩය



ශ්‍රී ලංකාවේ සංවර්ධන ක්‍රියාවලිය උදෙසා දෙස් විදෙස් ආයෝජන ප්‍රවර්ධනය කිරිම තුළින් ශ්‍රී ලංකාව ආසියාවේ ආර්ථික මූල්‍ය කේන්ද්‍රස්ථානයක් බවට පත් කිරීමේ අපේක්ෂාව පෙරදැරි කර ගත් "පොහොසත් රටක් ලස්සන ජීවිතයක්" තේමාවෙන් යුතු රජයේ ප්‍රතිපත්තිය සමඟ ඉදිරියටම ගමන් කිරීමට ආගමන විගමන දෙපාර්තමේන්තුව සැලසුම් කර තිබේ.

කලාපයේ ප්‍රමුඛතම ආගමන හා විගමන සේවාව බවට පත්වීමේ දැක්ම සාක්ෂාත් කර ගනු වස් කැප වී ක්‍රියා කරන ආගමන විගමන දෙපාර්තමේන්තුවේ 2025 වර්ෂයේ කාර්ය සාධන වාර්තාවට පණිවිඩයක් එක් කිරීමට ලැබීම භාග්‍යයක් කොට සලකමි.

සංචාරක ආකර්ෂණය වඩාත් වැඩිකර ගැනීම තුලින් විදේශ විනිමය උපයා ගැනීමේ අරමුණින් සහ අපේ රටට අහිමි වූ වෙළඳපොළ අවස්ථා වර්ධනය කර ගැනීමත්, ආගමන හා විගමන ක්‍රියාවලීන් වඩාත් සුමට කිරීම සඳහාත් රටවල් හතක් සඳහා සංචාරක වීසා නොමිලේ ලබා දීමට ක්‍රියා කිරීමට හැකි වීම සුවිශේෂි ජයග්‍රහණයක් ලෙස සඳහන් කල හැකිය. එමෙන්ම මගී නිශ්කාෂණ කටයුතු ක්‍රමවත් කිරීම උදෙසා බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල පරිශ්‍රයේ මගීන් පිටවීමේ සහ පැමිණීමේ දොරටු සඳහා ස්වයංක්‍රීය මගී නිශ්කාෂණ දොරටු (e-gates) හඳුන්වා දීමේ ව්‍යාපෘතිය සඵල කර ගැනීමට හැකිව ඇත. විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල/කාර්යාල මගින් මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ විදේශ ගමන් බලපත්‍ර අයදුම් කිරීම සඳහා පරිගණක දත්ත පද්ධතියට අවශ්‍ය වෙනස්කම් සිදුකරමින් පවතී. එමෙන්ම යන්ත්‍රානුසාරයෙන් කියවිය නොහැකි විදේශ ගමන් බලපත්‍ර (NMRP) භාවිතය වෙනුවට ඉලෙක්ට්‍රොනික යන්ත්‍රානුසාරයෙන් කියවිය හැකි ලියවිල්ලක් (ETD) නිකුත් කිරීමට කටයුතු සිදුකර ඇත. එලෙසම යුධ වාතාවරණ සමයේ අනුමත තොටුපලකින් හා විධිමත් ගමන් බලපත් භාවිතයෙන් තොරව රටින් පිටව ගොස් ඉන්දියාවේ සරණාගතභාවය ලද ශ්‍රී ලාංකිකභාවය තහවුරු කරන ලද තැනැත්තන් ස්වේච්ඡාවෙන් පෙරලා සිය රට පැමිණීමේදී ආගමන නිශ්කාෂණ පහසුකම් සිදුකර ඔවුනට බාධාවකින් තොරව රටතුලට ඇතුලු වීමට අවශ්‍ය පහසුකම් සැලසිම සඳහා  අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් පවතී. මහජනතාව සඳහා අප විසින් සපයනු ලබන අපගේ සේවාවන් වඩාත් කාර්යක්ෂම සහ පුළුල් කිරීම සඳහාත්, තවදුරටත් මහජනතාවට සමීප කිරීමේ පියවරක් ලෙසත් යාපනය ප්‍රාදේශීය කාර්යාලය 2025 වර්ෂය තුල ස්ථාපිත කිරීමට හැකිවීම ද, අප ලද ජයග්‍රහණයකි.

2025 වසර තුළ අපගේ දැක්ම, මෙහෙවර හා කාර්ය භාරයන් සපුරා ගැනීමට මඟ පෙන්වූ  අතිගරු ජනාධිපතිතුමා, ගරු අග්‍රාමාත්‍යතුමිය, අමාත්‍යාංශය භාර අමාත්‍යතුමා, අමාත්‍යාංශ ලේකම්තුමා මෙන්ම අනෙකුත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන ඇතුළු සියලුම රජයේ ආයතන වලට ද විදේශ දූත මණ්ඩලවල සේවයේ නියුතු නිලධාරීන්ට ද, සියලුම ජාත්‍යන්තර සංවිධානවලට හා සියලුම සේවාලාභීන්ට ද ස්තූතිය පුදකරනු ලබන අතර විශේෂයෙන් ඉමහත් කැපවීමකින් අඛණ්ඩ සේවාවක් මහජනතාව වෙත ලබා දීමට ඇප කැප වූ ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ සමස්ත කාර්ය මණ්ඩලයේ සේවය ඇගයීමට ද මෙය අවස්ථාවක් කොට ගනිමි.

**අයි. චමින්ද පතිරාජ**
පාලක ජනරාල්,
ආගමන හා විගමන දෙපාර්තමේන්තුව,
සුහුරුපාය,
බත්තරමුල්ල.

# පටුන


**01. පරිච්ඡේදය - ආයතනික පැතිකඩ**

| | | |
|---|---|---|
| 1.1 | හැඳින්වීම | 3 |
| 1.2 | දැක්ම, මෙහෙවර, ආයතනයේ අරමුණු | 4 |
| 1.3 | ප්‍රධාන කාර්යයන් | 4 |
| 1.4 | සංවිධාන සටහන | 5 |
| 1.5 | දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ හා ශාඛාවන් | 6 |

**02. පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම**

| | | |
|---|---|---|
| 2.1 | 2025 වර්ෂයේ දී අත්කරගත් ප්‍රගතිය | 7 |
| 2.2 | මෙහෙයුම් කාර්යයන් මගින් ආදායම් උපයා ගැනීමේ ප්‍රගතිය | 40 |
| 2.3 | විශේෂ ජයග්‍රහණ | 43 |
| 2.4 | අභියෝග | 44 |
| 2.5 | ඉදිරි ඉලක්ක | 44 |

**03. පරිච්ඡේදය- 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය** 46

**04. පරිච්ඡේදය- ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන දර්ශක** 62

**05. පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු** 65

**06. පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ** 67

**07. පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව** 68

**ඇමුණුම්**

**ඇමුණුම් 01 - විගණකාධිපතිවරයාගේ වාර්තාව** 75

# ආයතනික පැතිකඩ

# 01 පරිච්ඡේදය

## 1.1 හැඳින්වීම

ආගමන හා විගමන දෙපාර්තමේන්තුව 1948 අංක 20 දරන ආගාමික හා විගාමික පනත හා එහි සංශෝධනයන්ගේ ද, 1956 ආගාමික හා විගාමික පනතට අදාලව සැකසූ රෙගුලාසි හා එහි සංශෝධනයන්ගේ ද, පුරවැසිභාවය ප්‍රදානය කිරිමට අදාල පනත්වල විධිවිධානයන් යටතේ ද ලද නෛතික අධිකාරිය මත ක්‍රියාත්මක වේ.

ජාතික ආරක්ෂාව තහවුරු වන සේ ශ්‍රී ලාංකීය පුරවැසියන් නොවන තැනැත්තන් මෙරටට ඇතුළුවීම හා පිටවීම විධිමත්ව පාලනය කිරීම, මෙරට රැඳී සිටින ශ්‍රී ලාංකීය පුරවැසියන් නොවන තැනැත්තන්ගේ කටයුතු අධීක්ෂණය, ශ්‍රී ලාංකීය අනන්‍යතාවය විදේශියන්හිදී තහවුරු කිරීම සඳහා ශ්‍රී ලාංකිකයන්ගේ අවශ්‍යතාවය මත විදේශ ගමන් බලපත් නිකුත් කිරීම, විදේශිකයන්ට වීසා නිකුත් කිරීම හා විදේශයන්හි උපත ලබන ශ්‍රී ලාංකීය පුරවැසියන්ගේ දරුවන් සඳහා සහ මෙරට පුරවැසිභාවය ඉල්ලුම් කරන තැනැත්තන් සඳහා පුරවැසිභාවය ප්‍රදානය කිරීම මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යභාරය වේ. තවද නවීන තාක්ෂණ ක්‍රමවේදයන් භාවිතයෙන් සේවාලාභීන්ට වඩාත් කාර්යක්ෂම හා සුහදශීලී සේවයක් සපයා දීමට කාර්ය මණ්ඩලය නිරන්තරයෙන් කැපවී ක්‍රියා කරයි.

ආගමන හා විගමන දෙපාර්තමේන්තුව ජාතික අදායම් උත්පාදනය කිරීමෙහිලා සැලකිය යුතු දායකත්වයක් ලබා දෙන දෙපාර්තමේන්තුවකි. එසේම එහි ප්‍රතිඵලයක් ලෙස 2025 වර්ෂය තුළදී රුපියල් බිලියන 44.88 ක ආදායමක් ජාතික ආදායමට රැස් කර දීමට හැකියාව ලැබිණි.

**නෛතික අධිකාරිය**

» ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදි ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
» 1948 අංක 18 දරන පුරවැසි පනත සහ ඊට අදාල සංශෝධන
» 1948 අංක 20 දරන ආගාමික හා විගාමික පනත සහ ඊට අදාල සංශෝධන
» 1949 අංක 03 දරන ඉන්දියානු හා පාකිස්ථානු පදිංචිකරුවන්ගේ පුරවැසිභාවය පිළිබඳ පනත
» ආගාමික හා විගාමික නියෝග සහ ඊට අදාල සංශෝධන
» 1967 අංක 14 දරන ඉන්දු ලංකා ගිවිසුම ක්‍රියාවට නැංවීමේ පනත හා ඊට අදාල සංශෝධන
» 1988 අංක 39 දරණ ආදේශිකයන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ පනත
» 2003 අංක 35 දරන ඉන්දියානු සම්භවයක් සහිත තැනැත්තන්ට පුරවැසි භාවය ප්‍රදානය කිරීමේ පනත
» 2008 අංක 38 දරන චීන සම්භවයක් සහිත තැනැත්තන්ට පුරවැසි භාවය ප්‍රදානය කිරීමේ පනත
» ඉහත පනත්වලට අදාළ සියලුම රෙගුලාසි හා නියෝග
» ආගමන විගමන පාලක ජනරාල් විසින් නිකුත් කරනු ලබන චක්‍රලේඛ හා උපදෙස්

## 1.2 දැක්ම, මෙහෙවර, ආයතනයේ අරමුණු

### දැක්ම

කලාපයේ ප්‍රමුඛතම ආගමන හා විගමන සේවාව බවට පත්වීම

### මෙහෙවර

ජාතික ආරක්ෂාව හා සමාජ හර පද්ධතිය සුරක්ෂිත කිරීම සහ ආර්ථික සංවර්ධනයට ඉඩ ප්‍රස්ථා සලසමින්, රටින් බැහැරවන්නන් හා රටට ඇතුළුවන්නන් නියාමනය කිරීම හා පුරවැසි සේවා සැපයීම

### ප්‍රධාන අරමුණු හා ඉලක්කයන්

- ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් ප්‍රධාන පාර්ශවකරුවෙක් ලෙස කටයුතු කිරීම
- ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව නම් කරන ලද තොටුපළ හරහා නිත්‍යානුකූලව ඇතුළුවීම හා පිටවීම ඵලදායී ලෙස කළමනාකරණය කිරීම
- ශ්‍රී ලාංකික අනන්‍යතාවය විදේශයන්හිදී තහවුරු කිරීම
- සේවාලාභීන් සඳහා ගුණාත්මක හා කාර්යක්ෂම සේවාවක් සැපයීම තුළින් රාජ්‍ය සේවයේ විශිෂ්ඨතම රාජ්‍ය ආයතනය බවට පත්වීම

## 1.3 ප්‍රධාන කාර්යයන්

- ශ්‍රීලංකාවේ පුරවැසියන් නොවන තැනැත්තන් ශ්‍රී ලංකාවට ඇතුළු වීම පාලනය කිරීම පිටවීම විධිමත් කිරීම
- මෙරට රැඳී සිටින ශ්‍රී ලාංකික පුරවැසියන් නොවන තැනැත්තන්ගේ කටයුතු අධීක්ෂණය සහ ශ්‍රී ලංකාවේ පුරවැසියන් නොවන නොමනා තැනැත්තන් රටින් ඉවත් කිරීම
- ශ්‍රී ලාංකික පුරවැසියන් සඳහා විදේශ ගමන් බලපත් නිකුත් කිරීම
- විදේශිකයින් සඳහා වීසා බලපත් නිකුත් කිරීම හා දීර්ඝ කිරීම
- ශ්‍රී ලාංකික පුරවැසිභාවය ප්‍රදානය කිරීම හා ඊට ආනුශාංගික කාර්යය
- ද්විත්ව පුරවැසිභාවය ප්‍රදානය කිරීම හා ඊට ආනුශාංගික කාර්යය

## 1.4 සංවිධාන සටහන



## 1.5 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ හා ශාඛාවන්

### ගමන් බලපත්‍ර අංශය

- → ගමන් බලපත්‍ර ශාඛාව
- → ගමන් බලපත්‍ර පුද්ගලාරෝපනය කිරීමේ ශාඛාව
- → ගමන් බලපත්‍ර සංශෝධන ශාඛාව
- → විදේශ දූත මණ්ඩල ශාඛාව
- → තැපැල් ශාඛාව
- → ප්‍රාදේශීය කාර්යාල

### වීසා අංශය

- → වීසා ශාඛාව

### තොරතුරු තාක්ෂණ හා ප්‍රත්‍යන්ත පාලන අංශය

- → තොරතුරු තාක්ෂණ ශාඛාව
- → තොටුපොළ අංශය

### විමර්ශන අංශය

### අභ්‍යන්තර විගණන අංශය

### ප්‍රතිපත්ති, සංවර්ධන හා ප්‍රතිසංස්කරණ අංශය

- → ප්‍රතිපත්ති, සංවර්ධන හා ප්‍රතිසංස්කරණ ශාඛාව
- → ඉන්දු ලංකා පුරවැසි ශාඛාව
- → නීති ශාඛාව

### පුරවැසි අංශය

### ගිණුම් අංශය

### පාලන අංශය

- → පාලන ශාඛාව
- → පුහුණු හා සංවර්ධන ශාඛාව
- → ප්‍රසම්පාදන ශාඛාව
- → ප්‍රවාහන ශාඛාව
- → සුබසාධන ඒකකය
- → මහජන තොරතුරු ඒකකය
- → පිළිගැනීමේ කවුළුව
- → පියස පරිශ්‍රය

# ප්‍රගතිය හා ඉදිරි දැක්ම

# 02 පරිච්ඡේදය

## 2.1 2025 වර්ෂයේ දී අත්කරගත් ප්‍රගතිය

### 2.1.1 ගමන් බලපත්‍ර අංශය

පාලක(ගමන් බලපත්)ගේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන මෙම අංශය මහජනතාව සමග වඩාත් සමීපතම අංශය වේ. ශ්‍රී ලාංකිකයින්ට විදේශ රටවලට බාධාවකින් තොරව ගමන් කිරීමට, නැවතී සිටීමට හා ආපසු ඒමට භාවිතා කළ හැකි වන පරිදි ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව ගමන් බලපත්‍රයක් නිකුත් කරනු ලබයි. ගමන් බලපත්‍ර නිකුත් කිරීම එක් දින සේවාව හා සාමාන්‍ය සේවාව යටතේ සිදු කරනු ලබන අතර, මෙම සේවාවන් ප්‍රධාන කාර්යාලය හා ප්‍රාදේශීය කාර්යාල මගින් සිදු කරනු ලබයි.

මෙම අංශයේ කාර්යභාරය පහත සඳහන් ශාඛාවන් 5ක් හා ප්‍රාදේශීය කාර්යාල 5ක් ඔස්සේ ක්‍රියාත්මක වේ.

- ගමන් බලපත්‍ර ශාඛාව
- ගමන් බලපත්‍ර පුද්ගලාරෝපනය කිරීමේ ශාඛාව
- ගමන් බලපත්‍ර සංශෝධන ශාඛාව
- විදේශ දූත මණ්ඩල ශාඛාව
- තැපැල් ශාඛාව
- ප්‍රාදේශීය කාර්යාල - මහනුවර, වව්නියාව, කුරුණෑගල, මාතර, යාපනය

**අරමුණු හා කාර්ය භාරය**

1. නිවැරිදි ගුණාත්මක හා සත්‍ය තොරතුරු ඇතුළත් විදේශ ගමන් බලපත්‍ර ශ්‍රී ලාංකික පුරවැසියන් වෙත නිකුත් කිරීම සඳහා ක්‍රමවේදයන් අනුගමනය කිරීම.
2. ශ්‍රී ලාංකීය ගමන් බලපත්‍රයේ ප්‍රමිතිය ආරක්ෂා කිරීමට හා වැඩි දියුණු කිරීමට අදාළ ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම.
3. ශ්‍රී ලාංකිකයන්ගේ ආගමන හා විගමන කටයුතු සම්බන්ධයෙන් අධිකරණ නියෝග ක්‍රියාත්මක කිරීම.
4. ශ්‍රී ලාංකිකයන්ගේ ආගමන හා විගමන කටයුතු වලට අදාළව රාජ්‍ය ආරක්ෂක අංශ හා අනෙකුත් රාජ්‍ය ආයතන සමග මනා සම්බන්ධීකරණයකින් යුතුව කටයුතු කිරීම.

#### 2.1.1.1 ගමන් බලපත්‍ර පුද්ගලාරෝපනය කිරීමේ ශාඛාව

ගමන් බලපත්‍ර ශාඛාවෙන් සහ විදේශ දූත මණ්ඩල ශාඛාවෙන් නව ගමන් බලපත්‍ර සකස් කිරීම සඳහා සැකසුම් ශාඛාව වෙත යොමු වන අයඳුම්පත්‍ර අදාල පරීක්ෂා කිරීම් වලින් අනතුරුව මුද්‍රිත ගමන් බලපත්‍ර එක්දින සේවය යටතේ නිකුත් කරන ගමන් බලපත් නිකුත් කිරීමේ කවුළු වෙතත්, සාමාන්‍ය සේවය යටතේ නිකුත් කරන ගමන් බලපත් තැපැල් ශාඛාව වෙතටත්, විදේශ දූත මණ්ඩල හරහා ලැබෙන අයඳුම්පත් වෙනුවෙන් නිකුත් කරන ගමන් බලපත් විදේශ දූත මණ්ඩල ශාඛාවටත් යවනු ලබයි.
මීට අමතරව සංශෝධන කටයුතු සඳහා යොමු කෙරෙන අයඳුම්පත්‍ර අදාල පරීක්ෂා කිරීම් වලින් අනතුරුව දත්ත ඇතුළත් කිරීම (Data Entry), ඒවා නැවත පරීක්ෂා කිරීම (Validate) හා සංශෝධන තුන්වන වන පිටුවේ මුද්‍රණය කිරීම (Observation Print) ද සිදු කරනු ලබයි.
මෙම ක්‍රමවේදයට අමතරව අළුතින් ආරම්භ කරන ලද මාර්ගගත ක්‍රමය ඔස්සේ ඉල්ලුම් කරන ලද ගමන් බලපත් මුද්‍රණ ක්‍රියාවලියේදී අයදුම්පත් පරීක්ෂා කිරීම, ඊට අදාල Barcode සහිත අංක මුද්‍රණය කිරීම, ගමන් බලපත් මුද්‍රණය කිරීම ඇතුළු පසු අදියරයන් සියල්ලම සිදු කරනු ලබයි.

#### 2.1.1.2 ගමන් බලපත්‍ර සංශෝධන ශාඛාව

නිකුත් කරන ලද ගමන් බලපත්‍රයට අදාලව ගමන් බලපත්‍රලාභීන් විසින් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සලකා බලා විවිධ කාණ්ඩ යටතේ ගමන් බලපත්‍රයට සංශෝධනයන් ඇතුළත් කිරීම මෙම ශාඛාව මගින් සිදු කරනු ලබයි.

#### 2.1.1.3 විදේශ දූත මණ්ඩල ශාඛාව

විදේශගත ශ්‍රී ලාංකිකයන්ට විදෙස් ගමන් බලපත්‍ර නිකුත් කිරීම මෙම අංශය මගින් සිදු කරනු ලබයි. විදේශ දූත මණ්ඩල මගින් විදේශ කටයුතු අමාත්‍යාංශය හරහා මෙම දෙපාර්තමේන්තුව වෙත යොමු කෙරෙන අයදුම්පත් සඳහා සකස් කළ නව විදෙස් ගමන් බලපත් නැවත විදේශ කටයුතු අමාත්‍යාංශය හරහා විදේශ දූත මණ්ඩල වෙත යොමු කරන අතර විදේශ දූත මණ්ඩල මගින් අදාළ අයදුම්කරුවන් වෙත නිකුත් කිරීම සිදු කරයි.

#### 2.1.1.4 තැපැල් ශාඛාව

සාමාන්‍ය සේවය යටතේ සකස් කරනු ලබන ගමන් බලපත් ප්‍රමාදයකින් තොරව අයදුම්කරුවන්ට ලියාපදිංචි තැපැල් මගින් යැවීම මෙම අංශයේ ප්‍රධාන කාර්යය වේ.

#### 2.1.1.5 ප්‍රාදේශීය කාර්යාල

මාතර, මහනුවර, වවුනියාව, කුරුණෑගල හා යාපනය යන දිස්ත්‍රික්ක වල ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාල පිහිටා ඇති අතර සාමාන්‍ය සේවය හා එක්දින සේවය යටතේ ගමන් බලපත් නිකුත් කිරීම හා ගමන් බලපත්‍ර වල සංශෝධන කටයුතු එහිදි සිදු කරනු ලබයි.

### ගමන් බලපත් නිකුත් කිරීමේ ප්‍රගතිය

**2.1 වගුව : 2025 වර්ෂය තුළ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද සියලුම බලපත්‍ර සංඛ්‍යාව**

| රාජ්‍ය තාන්ත්‍රික | රාජකාරි | සියලුම රටවල් | හදිසි සහතික | එකතුව |
|---|---|---|---|---|
| 376 | 1,145 | 776,773 | 934 | 779,228 |

**2.2 වගුව : 2025 වර්ෂය තුළ ප්‍රාදේශිය කාර්යාල මගින් නිකුත් කරන ලද සියලුම බලපත්‍ර සංඛ්‍යාව**

| කාර්යාලය | ගමන් බලපත් සංඛ්‍යාව |
|---|---|
| මහනුවර | 44,207 |
| මාතර | 41,518 |
| කුරුණෑගල | 40,796 |
| වව්නියාව | 30,622 |
| යාපනය | 8,447 |

**2.3 වගුව : 2025 වර්ෂය තුළ මාර්ගගත ක්‍රමය ඔස්සේ නිකුත් කරන ලද ගමන් බලපත්‍ර සංඛ්‍යාව**

| හදිසි සේවාව | සාමාන්‍ය සේවය | සියලුම රටවල් |
|---|---|---|
| 4,461 | 26,847 | 31,308 |

**2.4 වගුව : 2025 වර්ෂය තුළ ප්‍රධාන කාර්යාලය සිදුකළ ගමන් බලපත්‍ර සංශෝධන සංඛ්‍යාව**

| කාණ්ඩය | ගමන් බලපත් සංඛ්‍යාව |
|---|---|
| එක් විදේශ ගමනකට වලංගු කිරීම | 130 |
| තනි ගමන් සීමාව අවලංගු කිරීම | 2,960 |
| ද්විත්ව පුරවැසිභාවය ඇතුලත් කිරීම | 165 |
| ජාතික හැඳුනුම්පත් අංකය ඇතුලත් කිරීම | 7,065 |
| විවාහයට පෙර නම ඇතුළත් කිරීම | 4,813 |
| වාසගම/ වෙනත් නම් සංශෝධනය | 339 |
| විවාහයට පසු නම ඇතුළත් කිරීම | 3,689 |
| වෙනත් නම් සංශෝධනය | 54 |
| වෙනත් සංශෝධනය 1 | 3,689 |
| වෙනත් සංශෝධනය 2 | 54 |
| විවාහයට පෙර වාසගම ඇතුළත් කිරීම | 3 |
| තනතුර සටහන් කිරීම/ තනතුර ඉවත් කිරීම | 7,604 |

**2.5 වගුව : 2025 වර්ෂය තුළ මෙම ශාඛාව ලියාපදිංචි කරන ලද, අනුමත කරන ලද, සහ නිකුත් කරන ලද ගමන් බලපත්‍ර සංඛ්‍යාව**

| කාර්යාලය | ලියාපදිංචි කරන ලද | අනුමත කරන ලද | නිකුත් කරන ලද |
|---|---|---|---|
| ජනවාරි | 5,208 | 5,127 | 8,244 |
| පෙබරවාරි | 4,299 | 5,009 | 6,322 |
| මාර්තු | 8,983 | 5,062 | 5,800 |
| අප්‍රේල් | 5,396 | 6.138 | 6,111 |
| මැයි | 5,208 | 5,185 | 5,343 |
| ජූනි | 5,224 | 5,350 | 6,327 |
| ජූලි | 5,648 | 7,019 | 5,715 |
| අගෝස්තු | 6,023 | 6,342 | 6,999 |
| සැප්තැම්බර් | 4.848 | 6,026 | 6,629 |
| ඔක්තෝබර් | 5,253 | 5,514 | 5,079 |
| නොවැම්බර් | 4,981 | 4,180 | 5,218 |
| දෙසැම්බර් | 5,167 | 6,087 | 6,451 |
| එකතුව | 66,238 | 67,039 | 74,238 |

**2020 - 2025 කාලය තුළ විදේශ දූත මණ්ඩල ශාඛාව මගින් නිකුත් කරන ලද ගමන් බලපත්‍ර පිළිබඳ තොරතුරු**




## 2.1.2 වීසා අංශය

1948 අංක 20 දරණ ආගාමික හා විගාමික පනතේ III කොටසෙහි ශ්‍රී ලංකාවේ පුරවැසියන් නොවන තැනැත්තන් ශ්‍රී ලංකාවට ඇතුළුවීම පාලනය කිරීමට අදාළ විධිවිධාන අනුව පනතට අදාළව සම්පාදනය වූ 1956 ආගමන හා විගමන රෙගුලාසීන් හි අංක 02 සිට අංක 35 ප්‍රකාරව ජාතික ආරක්ෂාව තහවුරු වන පරිදි ශ්‍රී ලංකාවට පැමිණෙන විදේශිකයන් සඳහා මෙරට තුළ නීත්‍යානුකූලව රැඳී සිටීමට වලංගු වීසා බලපත් නිකුත් කිරීම හා වීසා කාලය දීර්ඝ කිරීම මෙම අංශය මගින් සිදු කෙරේ.

රට තුලට පැමිණෙන විදේශිකයන්ට වීසා නිකුත් කිරීම හා දිර්ඝ කිරීම තුළින් රටේ ජාතික ආදායමට සුවි-ශේෂ දායකත්වයක් ලබා දීම, අත්‍යවශ්‍ය සේවයන් සඳහා සේවා නියුතු විදේශිකයන්ට පහසුකම් සැලසීම මගින් ජාතික සංවර්ධනයට දායක වීම, රටට හිතකර ආකාරයට වීසා ප්‍රතිපත්තීන් ක්‍රියාත්මක කිරීම මෙම අංශයේ මූලික අරමුණ වේ.

ඉහත ආගාමික හා විගාමික පනත සහ එහි රෙගුලාසිවලට අනුකූලව මෙරටට පැමිණෙන විදේශිකයන් සඳහා නේවාසික/ වාස වීසා හා නේවාසික නොවන වීසා යනුවෙන් ප්‍රධාන වීසා කාණ්ඩ දෙකක් යටතේ මෙම දෙපාර්තමේන්තුව මගින් වීසා නිකුත් කෙරේ.

- **නේවාසික / වාස වීසා**

විශේෂිත අරමුණු සඳහා ශ්‍රී ලංකාව තුළ දීර්ඝ කාලීනව වාසය කිරීමට අපේක්ෂා කරන පහත සඳහන් කාණ්ඩවලට අයත් ශ්‍රී ලාංකිකයන් නොවන පුද්ගලයින් හට මෙම වීසාවන් නිකුත් කෙරේ.

**01. ආයෝජක වීසා**

» විදේශික ආයෝජක
» ආයෝජන සමාගම් මණ්ඩලයක ආයෝජක

**02. සේවා නියුක්ති වීසා**

» ශ්‍රී ලංකා රජය යටතේ ව්‍යාපෘති වෘත්තිකයන්
» ආයෝජන මණ්ඩල ව්‍යාපෘති යටතේ වන ප්‍රවාසිකයන්
» කොළඹ වරාය නගර ආර්ථික විද්‍යා කොමිෂන් සභාව යටතේ වන ප්‍රවාසිකයන්
» පෞද්ගලික අංශයේ සමාගමක සේවා නියුක්ත ප්‍රවාසිකයන්

### 03. ආගමික වීසා

- පූජ්‍ය පක්ෂයේ සාමාජිකයන්
- ආගමික ක්‍රියාකාරීන්
- ආගමික ස්ථාන ඉදිකරන්නන්/ ආවතේවකරුවන්

### 04. අධ්‍යාපනික වීසා

- ශිෂ්‍යයන් / ගුරුවරු
- රජයේ අනුමත අධ්‍යාපනික ආයතනවල ශිෂ්‍යයන් / ගුරුවරු

### 05. රාජ්‍ය නොවන සංවිධාන හෝ ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන වීසා

- ඉහත සංවිධානවල නියෝජිතයන්

### 06. වෛද්‍ය වීසා

- ශ්‍රී ලංකාව තුළ වෛද්‍ය ප්‍රතිකාර අපේක්ෂා කරනු ලබන තැනැත්තන්

### 07. අධිකරණ නඩු

- අධිකරණයේ නඩු කටයුතු සඳහා පෙනී සිටින තැනැත්තන්

### 08. ලියාපදිංචි ඉන්දියානුවන්

- 1967 අංක 15 දරණ ඉන්දු ශ්‍රී ලංකා ගිවිසුම (ක්‍රියාවට නැගීමේ) පනතේ 13 වන වගන්තිය යටතේ ඉන්දීය පුරවැසියකු වශයෙන් ලියාපදිංචි වී ඇති යම් තැනැත්තකු - දීර්ඝ කිරීම් පමණි

### 09. රාජ්‍ය තාන්ත්‍රික හෝ රාජකාරි

- රාජ්‍ය තාන්ත්‍රික හෝ රාජකාරී සඳහා පැමිණෙන විදේශ මණ්ඩල නියෝජිතයින් සඳහා විදේශ කටයුතු අමාත්‍යාංශයේ නිර්දේශ මත ගාස්තු අය කිරීමකින් තොරව වීසා නිකුත් කිරීම හා දීර්ඝ කිරීම

### 10. කොළඹ වරාය නගර ආර්ථික කොමිෂන් සභා වීසා

- වරාය නගර කොමිෂන් සභා පදිංචිකරුවන් (අලුත්)
- වරාය නගර කොමිෂන් සභා ව්‍යාපාර

### 11. ඩිජිටල් සංචාරක වීසා

- ඩිජිටල් සංචාරකයින් එනම් ස්ථිර සේවා ස්ථානයක් නොමැතිව ජීවිකාව සඳහා ඩිජිටල් තාක්ෂණයන් භාවිත කරනු ලබන තැනැත්තන්

### 12. ශ්‍රී ලාංකික පුරවැසියකුගේ ඥාතිවරයකු සඳහා

- විදේශීය කලත්‍රයා
- විදේශීය කලත්‍රයාගේ/යැපෙන්නාගේ පියා/මව
- (මියගිය) ශ්‍රී ලාංකික පුරවැසියකුගේ විදේශීය කලත්‍රයා (නැවත විවාහ වී නොමැති නම්)
- මියගිය විදේශීය/ශ්‍රී ලාංකික කලත්‍රයාගේ යැපෙන දරුවන් (වයස අවුරුදු 22 වන තෙක්)
- (349 වන අධිකාරය වූ) පුරවැසි පනතේ 19, 20 හෝ 21 වන වගන්ති යටතේ ශ්‍රී ලාංකික පුරවැසිභාවය අත්හිටවනු ලැබූ තැනැත්තකු
- විදේශීය පුරවැසිභාවය සහිත ශ්‍රී ලාංකික දෙමව්පියන්ගේ දරුවන් (වයස අවුරුදු 22 දක්වා)
- විදේශීය දෙමව්පියන්/මාමණ්ඩිය/නැන්දම්මා
- ශ්‍රී ලාංකික පුරවැසියකුගේ විදේශීය භාරකරු
- මියගිය/පෙර ශ්‍රී ලාංකික වැන්දඹුවන්
- (349 වන අධිකාරය වූ) පුරවැසි පනතේ 19, 20 හෝ 21 වන වගන්ති යටතේ ශ්‍රී ලාංකික පුරවැසිභාවය අත්හිටවනු ලැබූ දික්කසාද වූ තැනැත්තකුගේ දරුවන් (වයස අවුරුදු 22 දක්වා)
- ශ්‍රී ලාංකික පුරවැසියකුගේ ශ්‍රී ලාංකික නොවන යැපෙන්නන්

### 13. නේවාසික ආගන්තුක යෝජනා ක්‍රමය (RGS)

- පවතින වීසා පත්‍රය දීර්ඝ කිරීම පමණි

### 14. මගේ සිහින නිවහන (SSRV)

- පවතින වීසා පත්‍රය දීර්ඝ කිරීම පමණි

## ■ නේවාසික නොවන වීසා (Non -Residence Visa)

කෙටි කාලීන අවශ්‍යතාවයන් සඳහා මෙරටට පැමිණීම සඳහා නිකුත් කරනු ලබන වීසා වර්ගයයි. එය පැමිණීමේ හා මාර්ගස්ථ වශයෙන් වන අතර පැමිණීමේ වීසා, සංචාරක හා ව්‍යාපාරික වශයෙන් දෙයාකාරවේ.

## ■ පැමිණීමේ වීසා (Visit Visa)

විදේශ රටවල පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල මගින් හා විද්‍යුත් සංචරණ අනුමැතිය (ETA) යටතේ සංචාරක හෝ ව්‍යාපාරික කටයුතු වෙනුවෙන් කෙටි කාලීනව විදේශිකයන් වෙත මෙම වීසා නිකුත් කරනු ලැබේ.

### 01. කෙටි කාලීන ව්‍යාපාරික කටයුතු සඳහා වන (Business Visa)

- සංචාරක නොවන කෙටි කාලීන ව්‍යාපාරික ස්වරූපයේ අනෙකුත් කටයුතු සඳහා ශ්‍රී ලංකාවට පැමිණෙන විදේශිකයන්ට මෙම වීසා නිකුත් කරනු ලැබේ. මේ සඳහා අදාළ කාර්යය තහවුරු කෙරෙන ලේඛන ඉදිරිපත් කළ යුතුය.
  (උදා: ව්‍යාපාරික සාකච්ඡා/ ආයතනික වැඩමුළු)

### 02. බහුවාර පිවිසුම් වීසා - ව්‍යාපාරික (Multiple Entry Business Visa)

» මෙම වීසා ද ව්‍යාපාරික කටයුතු සඳහා ශ්‍රී ලංකාවට පැමිණෙන විදේශිකයන්ට වසරක කාලයක් සඳහා ලබා දෙන අතර, මෙම වීසා ලබා ගැනීමෙන් පසු එක් වාරයකදී මෙරට රැඳී සිටිය හැකි කාලය උපරිම දින 180 කි.

### 03. සංචාරක කාර්යය සඳහා වීසා

පහත කාර්යයන් සඳහා ශ්‍රී ලංකාවේ සංචාරය කිරීමට කෙටිකාලීන ව පැමිණෙන විදේශිකයන් වෙනුවෙන් විද්‍යුත් සංචරණ අනුමැතිය යටතේ දින 30 ක කාලයක් සඳහා මෙම වීසා නිකුත් කෙරේ.

» MICE - සංචාරක කටයුතු - අයෝජක සම්මන්ත්‍රණ/ ප්‍රදර්ශන/ වැඩසටහන්/ ජම්බෝරිය (TOURISM-Investors Conferences/Exhibitions/Events/ Jamboree)
» ආයුර්වේද වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීම - හර්බල් Medical Treatment Including Ayurvedic (Herbal)
» කලා, සංගීත හා නර්තන වැඩසටහන් සඳහා සහභාගිවීම (Participant in art Music and dance Event)
» වන්දනා/ ක්‍රීඩා වැඩසටහන්/ විවාහ මංගල උත්සවවලට සහභාගිවීම (Participant in Pilgrimages/ Sport Event/ Weddings)
» සංචාර හෝ නිවාඩුගත කිරීම සඳහා (Sightseeing or Holidaying)
» හිතමිතුරන් හා ඥාතීන් බැලීම සඳහා (Visiting Friends and Relatives)

### ■ මාර්ගස්ථ වීසා (Transit Visa)

ශ්‍රී ලංකාවෙන් බැහැරව වෙනත් රටක සිට තවත් රටක ගමනාන්තයක් කරා යන අතරතුර දී ශ්‍රී ලංකාවට ඇතුළුවීම සඳහා නිකුත් කරනු ලබන වීසාවකි. මෙය දින 2 ක උපරිමයකට යටත්ව නොමිලේ නිකුත් කරනු ලැබේ.

- ශ්‍රී ලංකාව හරහා වෙනත් ගමනාන්තයක් කරා යන මගියෙකුට දින දෙකක් ගාස්තු ගෙවීමකින් තොරව මාර්ගස්ථ වීසාවක් ලබා දේ.
- ශ්‍රී ලංකාවේ වරායක් හරහා මගී යාත්‍රාවකින් යන සංචාරකයන්ට මෙරට තුළ දින 04 ක් සංචාරය කිරීමට මාර්ගස්ථ වීසාවක් ලබා දීමට ඇමරිකානු ඩොලර් 25 ක ගාස්තුවක් අය කෙරේ.
- ශ්‍රී ලංකාවෙහි ජල තීරයෙහි ඇති නැවක වෙළඳ නාවික පිරිස් සාමාජිකයින් හට දින 30 ක කාලයක් ගොඩබිමට පැමිණීම සඳහා ගාස්තු අය කිරීමකින් තොරව වෙරළ අවසර පත්‍රයක් ලබාදේ. ඔවුන් තව දුරටත් රැඳී සිටින්නේ නම් ඉදිරි මාස 02 ක් සඳහා මාසික ගාස්තුව ඇමරිකානු ඩොලර් 25 ක් ගෙවීමෙන් වෙරළ අවසර පත්‍රය දීර්ඝ කර ගත හැක. පැමිණි දින සිට මාස 05 කට වඩා වැඩි කාලයක් නැවතී සිටීම පිණිස වීසා ලබා ගැනීම සඳහා අයදුම් කරනු ලැබිය යුතුය .

ඉහත සඳහන් වීසා ලබා දීමේ දී ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් සලකා බලා ගනු ලබන තීරණයන්ට අනුව වීසා නිකුත් කිරීම සඳහා දැනට පවතින ක්‍රමවේදයම අනුගමනය කිරීම සහ ඒ අනුව, ආරක්ෂක නිශ්කාෂණ වාර්තා ලබා ගැනීම හා අමාත්‍ය මණ්ඩල තීරණ පරිදි නේවාසික වීසා සඳහා සෞඛ්‍ය ආරක්ෂණ සැලැස්ම ලබා ගැනීම තවදුරටත් ඒ අයුරින්ම ක්‍රියාත්මක වේ.

## ■ ස්ථිර වාස වීසා (Permanent Residence)

ද්විත්ව පුරවැසිභාවය ඉල්ලුම් කිරීමට හැකියාවක් නොමැති ශ්‍රී ලාංකික පුරවැසිභාවය හිමිව තිබූ පුද්ගලයන් සඳහා ද, ශ්‍රී ලාංකික පුරවැසියකුගේ විදේශීය කලත්‍රයාට හා විදේශීය දරුවන්ට ස්ථිර වාස වීසාවක් නිකුත් කිරීම සඳහා කටයුතු සම්පාදනය කර ඇති අතර, ඉහත ක්‍රමවේදය අනුව වීසා ලබා දීම ඉක්මනින් ආරම්භ කිරීමට අපේක්ෂා කෙරේ.

## 2025 වර්ෂය තුළ වීසා අංශය විසින් සිදු කරන ලද විශේෂ කාර්යයන්

### 1. Bay of Bengal Initiative for Multi-Sectoral Technical and Economic Cooperation (BIMSTEC) හි වීසා කටයුතු පිළිබඳ පස්වන විශේෂඥ කණ්ඩායම් රැස්වීම 2025 නොවැම්බර් මස 18 සහ 19 දෙදිනයන් හි දී කොළඹ දී පැවැත්වීම.




Bay of Bengal Initiative for Multi-Sectoral Technical and Economic Cooperation (BIMSTEC) යනු බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල් වන බංගලාදේශය, භූතානය, ඉන්දියාව, මියන්මාරය, නේපාලය, ශ්‍රී ලංකාව සහ තායිලන්තය යන සාමාජික රටවල් 07ක් එක්ව ආරම්භ කර ඇති කලාපීය සංවිධානයකි. එම සංවිධානය විසින් කලාපීය සම්බන්ධතා සහ සහයෝගීතාවය වර්ධනය කිරීමේ අරමුණින් සාමාජික රටවල් අතර වීසා ක්‍රියාවලීන් විධිමත් සහ සරළ කිරීම සඳහා වීසා කටයුතු පිළිබඳ විශේෂඥ කණ්ඩායමක් ස්ථාපිත කර ඇත.




ශ්‍රී ලංකාව 2025 වර්ෂය සඳහා සත්කාරක රට ලෙස නම් කර තිබූ හෙයින් වීසා කටයුතු පිළිබඳ විශේෂඥ කණ්ඩායමේ 5 වන රැස්වීම සංවිධානය කිරීමේ කටයුතු ආගමන හා විගමන දෙපාර්තමේන්තුව වෙත පැවරී තිබිණි. ඒ අනුව, වීසා අංශය විසින් මෙම රැස්වීම පැවැත්වීම සඳහා සියලු කාර්යයන් සිදු කරන ලදී.

2025 නොවැම්බර් මස 18 හා 19 දිනවල කොළඹ Courtyard by Marriott හෝටලයේ දී සාමාජික රටවල් සියල්ලන්ගේම ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සහභාගී වූ අතර ඔවුන් විසින් මෙම රටවල් අතර වීසා කටයුතු පිළිබඳව සහ ජනතාව අතර සබඳතා වර්ධනය කිරීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග පිළිබඳව සාකච්ඡා කරන ලදී.




රැස්වීමෙහි පළමු දින මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් ආරම්භක සැසිය පැවැත් වූ අතර රැස්වීමේ කටයුතු වලින් පසුව එදිනම සවස මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යවරයාගේ සහභාගීත්වයෙන් රාත්‍රී භෝජන සංග්‍රහයක් ද පවත්වන ලදී. දෙවන දිනයේ දී රැස්වීම අවසානයේ නගර සංචාරයක් ද සූදානම් කරන ලදී.



මෙම රැස්වීමේ කටයුතු සියල්ලක්ම විදේශ කටයුතු අමාත්‍යාංශයේ ද මඟ පෙන්වීම යටතේ මෙම අංශය විසින් සිදු කරන ලදී.




**2. ආයෝජක කාණ්ඩයේ ප්‍රථම වීසාව ලබා දීම.**

අංක 2360/24 දරණ 2023/11/27 දිනැති අතිවිශේෂ ගැසට් නිවේදනය මඟින් සංශෝධිත ආගාමික හා විගාමික නියෝග අනුව වාස වීසා යටතේ ආයෝජක කාණ්ඩයෙහි පහත පරිදි වීසා නිකුත් කිරීමට මාර්ගෝපදේශ සකස් කිරීම 2025 වර්ෂයේ දී සිදු කරන ලදී.

- ඇමරිකානු ඩොලර් 100,000 සඳහා වසර 05
- ඇමරිකානු ඩොලර් 200,000 සඳහා වසර 10

මෙම ආයෝජක වීසා කාණ්ඩයට අදාල මාර්ගෝපදේශය සකස් කිරීමේ දී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දායකත්වය ලබාදෙන ලදී. ඒ අනුව, එහි ප්‍රථම වීසාව 2025/10/01 දින ගරු මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යවරයාගේ ප්‍රධානත්වයෙන් ලබා දෙන ලදී



**3. ඩිජිටල් නෝමැඩ් (Digital Nomad) කාණ්ඩයේ වීසා ලබා දීමට අදාළ මාර්ගෝපදේශ සැකසීම.**

අංක 2360/24 දරණ 2023/11/27 දිනැති අතිවිශේෂ ගැසට් නිවේදනය මඟින් සංශෝධිත ආගාමික හා විගාමික නියෝග අනුව වාස වීසා යටතේ ඩිජිටල් නෝමැඩ් (Digital Nomad) කාණ්ඩයෙහි වීසා නිකුත් කිරීමට මාර්ගෝපදේශ සකස් කිරීම 2025 වර්ෂයේ දී සිදු කරන ලදී.

මෙම වීසා කාණ්ඩයට අදාළ මාර්ගෝපදේශය සකස් කිරීමේ දී ඩිජිටල් අමාත්‍යාංශයේ දායකත්වය මෙන්ම වීසා නිකුත් කිරීමේ දී ඩිජිටල් අමාත්‍යාංශයේ නිර්දේශ ලබා දීමට එකඟතාවය ද පළ කරන ලදී.




**4. ආගාමික හා විගාමික නියෝග සංශෝධනය**

මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ උපදෙස් මත පවතින වීසා කාණ්ඩ සහ වීසා ක්‍රමවේදය අධ්‍යයනය කර නිර්දේශ ලබාදීම සඳහා කමිටුවක් පත් කරන ලදී.

ඒ අනුව, අංක 2360/24 දරණ 2023/11/27 දිනැති අතිවිශේෂ ගැසට් නිවේදනය මඟින් ප්‍රකාශයට පත් කරන ලද වීසා කාණ්ඩයන් සහ ඊට පෙර පැවති වීසා කාණ්ඩයන් අධ්‍යයනය කර, වර්තමානයේ පවතින අවශ්‍යතාවයන්ට අනුව වීසා කාණ්ඩ හඳුනා ගැනීම හා වීසා ක්‍රමවේදය සරළ කිරීම සඳහා අදාළ කමිටු සාමාජිකයින් විසින් සාකච්ඡා කරන ලදී.

2025 වසර අවසාන වන විට සාකච්ඡා කරන ලද තොරතුරු ඇතුළත් ලේඛන සකස් කරන ලදී.

## 2025 වර්ෂය තුළ වීසා ශාඛාව අත්කරගත් ප්‍රගතිය

**2,037,248**
ඉ - සංචරණ අනුමැතිය ලබාදීම් (On Line)

**268,104**
ඉ - සංචරණ අනුමැතිය ලබාදීම් (On Arrival)

**22,861**
වාස වීසා නිකුත් කිරීම්

**20,251**
වාස වීසා දීර්ඝ කිරීම්

**57,886**
කෙටි කාලීන වීසා දීර්ඝ කිරීම්

**1,857**
ද්විත්ව පුරවැසිභාවය ලබාගැනීම හේතුවෙන් වීසා අවශ්‍යතාවයෙන් මුදා හැරීම (ශ්‍රී ලාංකික)

## 2019 සිට 2025 වර්ෂය දක්වා විද්‍යුත් සංචරණ අනුමැතිය ලබාදීම්, නව වීසා නිකුත් කිරීම් සහ දීර්ඝ කිරීම්වලට අදාළ ප්‍රගතිය















## වාස වීසා දීර්ඝ කිරීම් හා නිකුත් කිරීම් පිළිබඳ විස්තරාත්මක සටහන - 2025

| අනු අංකය | වාස වීසා වර්ගය | දීර්ඝ කිරීම් | නිකුත් කිරීම් | තානාපති කාර්යාල වෙත යවනු ලැබූ ෆැක්ස් පණිවිඩ | ගුවන් තොටුපළ වෙත යවනු ලැබූ පණිවිඩ |
|---|---|---|---|---|---|
| 01 | ආයෝජක කාණ්ඩය | 02 | 05 | - | - |
| 02 | ආයෝජක - කාණ්ඩය ඊ | 01 | 02 | - | - |
| 03 | ආයෝජක - කාණ්ඩය ඝ | 46 | 05 | 01 | - |
| 04 | ආයෝජන මණ්ඩලයේ අනුමත ආයතනවල සේවයේ නියුතු | 2,850 | 1,860 | 2,171 | 67 |
| 05 | පුද්ගලික අංශයේ සේවයේ නියුතු | 4,595 | 7,438 | 4,661 | 225 |
| 06 | රාජ්‍ය අංශය | 1,140 | 1,053 | 1,150 | 277 |
| 07 | කොළඹ වරාය නගරය | 900 | 4,059 | 250 | 6,005 |
| 08 | පූජ්‍ය පක්ෂය | 769 | 396 | 337 | 51 |
| 09 | ආගමික වෘත්තිකයින් | 75 | 115 | 142 | 15 |
| 10 | අධ්‍යාපනික | 2,046 | 1,387 | 1,169 | 147 |
| 11 | රාජ්‍ය නොවන සංවිධාන (NGO) | 289 | 177 | 179 | 31 |
| 12 | රාජ්‍ය නොවන සංවිධාන (NGO) | 80 | 01 | 58 | 10 |
| 13 | වෛද්‍ය හේතූන් මත පැමිණි | 1,009 | 289 | - | - |
| 14 | උසාවි නියෝග | 261 | 101 | - | - |
| 15 | ලියාපදිංචි ඉන්දියානුවන් | 05 | - | - | - |
| 16 | රාජකාරි | 216 | 285 | 245 | 30 |
| 17 | රාජතාන්ත්‍රික | - | - | 299 | 28 |
| 18 | ශ්‍රී ලාංකික දෙමාපියන්ගේ දරුවන් | 176 | 257 | - | - |
| 19 | පුරවැසි පනතේ 5.2 වගන්තිය යටතේ | 1,857 | - | - | - |
| 20 | පුරවැසි පනතේ 11 වගන්තිය යටතේ | | - | - | - |
| 21 | පෙර ශ්‍රී ලාංකිකයන්ව සිටි | 2,373 | 3,640 | - | - |
| 22 | ශ්‍රී ලාංකික පුරවැසියන්ගේ කලත්‍රයන් | 3,205 | 1,696 | - | - |
| 23 | සේවයේ නියුතු විදේශීය කලත්‍රය-න් | 08 | 01 | - | - |
| 24 | ශ්‍රී ලාංකික පුරවැසියන්ගේ යැ-පෙන්නන් | 10 | 05 | - | - |
| 25 | ශ්‍රී ලාංකික දරුවන්ගේ දෙමාපියන් | 38 | 26 | - | - |
| 26 | කොළඹ වරාය නගරය (ව්‍යාපාර) | - | - | - | 04 |
| 27 | Digital Nomad | 02 | - | - | - |
| 28 | ආගන්තුක (R G S) | 02 | - | - | - |
| 29 | රන් පාරාදීසය (GOLDEN PAR-ADISE) | 01 | - | - | - |
| 30 | මාගේ සිහින නිවහන (SSRV) | 151 | 03 | - | - |
| 31 | SAARC වීසා | - | 103 | - | - |
| 32 | සහාදිපත්‍ය දේපළ | 1 | 0 | 0 | 9 |
| 33 | ඉදිකිරීම් ක්ෂේත්‍රය | - | - | - | 01 |
| | එකතුව | 22,108 | 22,801 | 10,662 | 6,900 |

**වීසා නිදහස් කිරීම් - 2025**

| වීසා වර්ගය | සංඛ්‍යාව |
|---|---|
| පුරවැසි පනතේ 11 වගන්තිය යටතේ | 301 |
| ද්විත්ව පුරවැසි | 1,783 |
| පුරවැසි පනතේ 5.2 වගන්තිය යටතේ | 1,442 |
| රාජතාන්ත්‍රික | 307 |
| රාජ්‍ය නොවන සංවිධාන (NGO) | 19 |
| රාජකාරි | 18 |

## 2.1.3 තොරතුරු තාක්ෂණ හා ප්‍රත්‍යන්ත පාලන ශාඛාව

### 2.1.3.1 තොරතුරු තාක්ෂණ අංශය

තොරතුරු තාක්ෂණ අංශයේ මූලික වගකීම වන්නේ දැනට පවත්නා මෘදුකාංග හා දෘඩාංග බාධාවකින් තොරව පවත්වා ගෙන යාම සහ මහජනතාවට උපරිම සේවා පහසුව සැලසෙන පරිදි නව ක්‍රමවේද හඳු-න්වා දෙමින් තොරතුරු තාක්ෂණ පද්ධතිය වැඩිදියුණු කිරීම වේ.
එමෙන්ම මෙම දෙපාර්තමේන්තුවේ පරිගණක පද්ධතිය සඳහා සේවා සපයන බාහිර ආයතන සමග නිසි පරිදි ගිවිසුම් යාවත්කාලීන කිරීම සහ ගිවිසුම් ප්‍රකාරව කටයුතු පවත්වා ගෙන යාම අධීක්ෂණය කිරීමද මෙම අංශයේ තවත් කර්තව්‍යයක් වේ.
තවද, රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, අධිකරණ, ආරක්ෂක අංශ (පොලිසිය හා ත්‍රිවිධහමුදා), ව්‍ය-වස්ථාපිත මණ්ඩල, කොමිෂන් සභා, රාජ්‍ය බැංකු හා මූල්‍ය ආයතන ඇතුළු විවිධ ආයතන වලින් ඉල්ලා සිටිනු ලබන විවිධ පුද්ගලයන්ගේ විදේශ ගමන් සම්බන්ධ වාර්තා මෙම දෙපාර්තමේන්තුවේ දත්ත පද්ධති-යේ පවතින තොරතුරු අනුව අදාළ ආයතන වෙතත් නිකුත් කිරීමද, මෙම අංශය මඟින් සිදු කරනු ලබයි.

ඉහතින් දැක්වූ මූලික කාර්යයභාරයන්ට අමතරව පහත දැක්වෙන කාර්යයන්ද තොරතුරු තාක්ෂණ අංශය මගින් ඉටු කරනු ලබයි.

1. මහජන අවශ්‍යතා කෙරෙහි සංවේදී වෙමින් පවත්නා පරිගණක මෘදුකාංග මොඩියුලර් පහ සඳහා හඳුනාගත් වැඩිදියුණු කිරීම් සිදුකොට සේවා ඵලදායිතාව ඉහළ නැංවීම
2. දෙපාර්තමේන්තු වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම
3. පවතින දෘඩාංග හා මෘදුකාංග පද්ධතිය වැඩිදියුණු කිරීම (Upgrade)
4. උසාවි නියෝග මත මඟී ගුවන් ගමන් පිළිබඳව අවශ්‍ය කටයුතු යාවත්කාලීන කිරීම

   මෙම කාර්යය දැනට මෙම දෙපාර්තමේන්තුව වෙත ලැබෙන උසාවි නියෝග මත සිදුකරනු ලබන අතර එම කාර්යයේදී සිදුවිය හැකි ප්‍රමාදයන් වළක්වා ගැනීම සඳහා අදාළ Interface Development මගින් ගුවන් ගමන් තහනම් කිරීමේ කටයුතු උසාවිය වෙතම පැවරීම සඳහා Central Black List ව්‍යාපෘතිය වැඩිදියුණු කරමින් පවතී

5. පාලක (ගමන්බලපත්) ගේ නියෝග පරිදි ගමන් බලපත් අසාදු ලේඛණගත කිරීමට අවශ්‍ය කටයුතු කිරීම

## 2025 වර්ෂය තුළ අත්කරගත් ප්‍රගතිය

### 01. උසාවි නියෝග මත මගී ගුවන් ගමන් පිළිබඳව අවශ්‍ය කටයුතු යාවත්කාලීන කිරීම

| | | |
|---|---|---|
| » ගුවන් ගමන් තහනම් කිරීම, සම්පූර්ණයෙන්ම ඉවත් කිරීම සහ තාවකාලිකව ඉවත් කිරීමට අදාළව ක්‍රියාත්මක කල උසාවි නියෝග සංඛ්‍යාව | - | 66,323 |
| » ගමන් තහනම් පරීක්ෂා කල සංඛ්‍යාව | - | 14,280 |

### 02. ගමන් බලපත් අසාදු ලේඛණගත කිරීම සහ ඉවත් කිරීම

| | | |
|---|---|---|
| » ගමන් බලපත් අසාදු ලේඛණගත කරන ලද සංඛ්‍යාව | - | 15,174 |
| » අසාදු ලේඛණයෙන් ඉවත් කරන ලද සංඛ්‍යාව | - | 509 |
| » අසාදු ලේඛණගත නොකර ගමන් බලපත් වලින් NIC පමණක් ඉවත් කිරීම | - | 547 |
| » ගමන් බලපත්‍ර අක්‍රිය හා සක්‍රිය කිරීම | - | 1,236 |

| | | |
|---|---|---|
| **03. රජයේ අමාත්‍යංශ, දෙපාර්තමේන්තු, අධිකරණ, පොලිසිය හා ත්‍රිවිධ හමුදා, කොමිෂන් සභා ඇතුළු විවිධ ආයතන වලින් ඉල්ලා සිටින විවිධ පුද්ගලයින්ගේ විදේශ ගමන් සම්බන්ධව නිකුත් කරන ලද වාර්තා සංඛ්‍යාව** | - | 31,883 |

### 04. අස්ථානගත වූ සොරකම් කරන ලද ගමන් බලපත්‍ර ඒකකය (SLTD)

අස්ථාන ගත වූ හෝ සොරකම් කරන ලද ගමන් බලපත්‍ර පිළිබඳව පොලිස් ස්ථාන විසින් ලබාදෙන තොරතුරු මධ්‍යම තොරතුරු කාර්යාංශය හෝ විදේශ දූත මණ්ඩල කාර්යාල විසින් ඍජුවම හෝ දෙපාර්තමේන්තුව වෙත තොරතුරු සම්පේෂණය කරනු ලැබේ. ඒවා විමර්ශනය කර එම ගමන් බලපත්‍ර නැවත පරිහරණය කළ නොහැකි පරිදි අවලංගු කර ජාත්‍යන්තර පොලිසිය (INTERPOL) වෙත යවනු ලබයි.

| | | |
|---|---|---|
| » 2025/01/01 දින සිට 2025/12/31 දින දක්වා මධ්‍යම තොරතුරු කාර්යාංශය (NCB) හා විදේශීය දූත මණ්ඩල (SLDM) විසින් එවා ඇති දෙපාර්තමේන්තු දත්ත පද්ධතියට ඇතුලත් වූ ගමන් බලපත්‍ර සංඛ්‍යාව | - | 2,505 |

### 05. ඒකාබද්ධ තොරතුරු කළමනාකරණ ඒකකය (EMS)

ආගමන හා විගමන තොරතුරු හා සංඛ්‍යාලේඛන ලබාදීම සඳහා ඒකාබද්ධ තොරතුරු කළමනාකරණ ඒකකය(EMS) ස්ථාපනය කරන ලදී

» 2025/01/01 දින සිට 2025/12/31 දින දක්වා මෙම ඒකකය මගින් තානාපති කාර්යාල හා විදේශ දූත මණ්ඩල වෙත පිළිතුරු ලබා දී ඇති විමසුම් සංඛ්‍යාව

| ආයතනය | එකතුව |
|---|---|
| නවදිල්ලියේ පිහිටි නෝර්විජියානු තානාපති කාර්යාලය | 05 |
| ඇමරිකානු තානාපති කාර්යාලය | 21 |
| ඕස්ට්‍රලියානු මහ කොමසාරිස් කාර්යාලය | 31 |
| කැනඩා මහ කොමසාරිස් කාර්යාලය | 130 |
| එක්සත් රාජධානියේ මහ කොමසාරිස් කාර්යාලය | 118 |
| ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය බ්‍රිතාන්‍ය | 15 |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය බුද්ධි ඒකකය | 50 |
| එකතුව | 370 |

## 06. නැවත භාරගැනීමේ ගැටළු කළමනාකරණ පද්ධතිය (RCMS)

විදේශයකදී පිටුවහල් කරන ශ්‍රී ලාංකිකයින් සඳහා ඒ ඒ රටවල පිහිටුවා ඇති තානාපති කාර්යාල මගින් ඔවුන්ගේ ශ්‍රී ලාංකිකභාවය තහවුරු කර ඉන්පසු පරිගණක පද්ධතිය මගින් අප දෙපාර්තමේන්තුවට යොමුකරනු ලබයි. එම පද්ධතිය තුලින්ම දෙපාර්තමේන්තුව සතු දත්ත සහ පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ දත්ත උපයෝගී කරගෙන අවසාන වශයෙන පුද්ගලයාගේ ශ්‍රී ලාංකිකභාවය තහවුරුකිරීම කරනු ලබයි. ඉන්පසු තාවකාලික ගමන් ලියවිල්ලක් නිකුත් කිරීම සඳහා නිර්දේශය ලබාදේ.

» 2025/01/01 දින සිට 2025/12/31 දක්වා කාලය තුළ, මෙම දෙපාර්තමේන්තුව මගින් පුද්ගලයන්ගේ ශ්‍රී ලාංකිකත්වය තහවුරු කර, තාවකාලික ගමන් ලියවිලි නිකුත් කිරීම සඳහා ශ්‍රී ලාංකික තානාපති කාර්යාල වෙත නිකුත් කර ඇති නිර්දේශ සම්බන්ධ විස්තර පහතින් දැක්වේ.

| රට | RCMS මගින් ශ්‍රී ලාංකිකත්වය තහවුරු කර නිර්දේශ කරන ලද සංඛ්‍යාව 2025.12.31 දිනට |
|---|---|
| ඕස්ට්‍රේලියාව | 51 |
| ඔස්ට්‍රියාව | 02 |
| බහරේන් | 48 |
| බෙල්ජියම | 06 |
| කැනඩාව | 52 |
| චීනය | 36 |
| කියුබාව | 04 |
| ඩුබායි | 1,309 |
| ඊජිප්තුව | 04 |
| පින්ලන්තය | 01 |
| ප්‍රංශය | 104 |
| ජර්මනිය | 79 |
| ග්‍රීසිය | 08 |
| ඉන්දියාව | 442 |
| ඉන්දුනීසියාව | 10 |
| ඉරානය | 05 |
| ඊශ්‍රායලය | 07 |
| ඉතාලිය | 114 |
| ජපානය | 74 |
| ජෝර්දානය | 20 |
| කෙන්යාව | 05 |
| දකුණු කොරියාව | 04 |

| රට | RCMS මඟින් ශ්‍රී ලාංකිකත්වය තහවුරු කර නිර්දේශ කරන ලද සංඛ්‍යාව 2025.12.31 දිනට |
|---|---|
| කුවේට් | 3,587 |
| ලෙබනනය | 21 |
| මැලේසියාව | 279 |
| මාලදිවයින | 32 |
| නේපාලය | 10 |
| නෙදර්ලන්තය | 17 |
| ඕමානය | 790 |
| පාකිස්තානය | 16 |
| පෝලන්තය | 09 |
| කටාර් | 300 |
| රුමේනියා | 14 |
| රුසියානු සමූහාණ්ඩුව | 62 |
| සෞදි අරාබියාව | 1,523 |
| සිංගප්පූරුව | 07 |
| ස්ලෝවැකියාව | 02 |
| ස්වීඩනය | 13 |
| ස්විට්සර්ලන්තය | 114 |
| තායිලන්තය | 69 |
| තුර්කිය | 17 |
| එක්සත් රාජධානිය | 62 |
| ඇමරිකා එක්සත් ජනපදය | 56 |
| එකතුව | 9,385 |

### 2.1.3.2 තොටුපළ ශාඛාව

ශ්‍රී ලංකාවේ පුරවැසියන් නොවන තැනැත්තන් ශ්‍රී ලංකාවට ඇතුළුවීම පාලනය කරමින්, එකී විදේශ ගමන් බලපත්‍ර දරන්නන් ශ්‍රී ලංකාවෙන් පිටවීම විධිමත් කිරීම, ශ්‍රී ලාංකික ගමන් බලපත්‍රධාරීන් ඇතුළු සමස්ත ආගාමිකයන්ගේ හා විගාමිකයන්ගේ නිශ්කාෂණ කටයුතු කාර්යක්ෂමව හා ඵලදායීව, ජාතික ආරක්ෂාවට ප්‍රමුඛත්වය ලබාදෙමින්, ජාතික ආර්ථිකයට ධනාත්මක උත්තේජනයක් ඇතිවන පරිදි, දිවයින වටා පිහිටි සියලුම සක්‍රීය, අනුමත මුහුදු හා ගුවන් තොටුපලවලදී ප්‍රත්‍යන්ත පාලනය ඉටුකිරීම. ඒ සඳහා අවශ්‍ය භෞතික හා මානව ආධාරක සේවා සැපයීම, සමස්ත සේවාලාභීන් සම්බන්ධීකරණය කිරීම. මීට අමතරව ශ්‍රී ලංකාව තුළ විදේශ දූත මණ්ඩල හා වීසා අංශ ස්ථාපනය කර නොමැති විදේශ රටවලට ශ්‍රී ලාංකික ගමන් බලපත්‍ර දූතායතනය (කුරියර්) කිරීමට අවශ්‍ය නෛතිකමය අධිකාරය ආගමන හා විගමන පාලක ජනරාල්වරයා වෙනුවෙන් ලබාදීම, රාජ්‍ය හා අර්ධ රාජ්‍ය අංශයේ නීතිය බලාත්මක කිරීමේ ආයතනවලට අවශ්‍ය වන ප්‍රත්‍යන්ත පාලන තොරතුරු අවශ්‍යතාවය මත ලබාදීම මෙම අංශය මඟින් සිදු කරනු ලබයි.

## 2.1.3.3 අනුමත ඇතුළුවීමේ හා පිටවීමේ තොටුපළ

1. කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ
2. මහින්ද රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපළ - මත්තල
3. කොළඹ ජාත්‍යන්තර ගුවන්තොටුපළ - රත්මලාන
4. කොග්ගල ගුවන්තොටුපළ
5. යාපනය ජාත්‍යන්තර ගුවන්තොටුපළ
6. මඩකලපුව ජාත්‍යන්තර ගුවන්තොටුපළ

1. කොළඹ වරාය
2. ගාල්ල වරාය
3. ත්‍රිකුණාමලය වරාය
4. හම්බන්තොට ජාත්‍යන්තර වරාය
5. තලේමන්නාරම් ජැටිය
6. නොරොච්චෝලෙයි වරාය
7. ඔලුවිල් වරාය
8. කන්කසන්තුරෙයි වරාය
9. කොළඹ වරාය නගරය විශේෂ ආර්ථික කලාපය

### එක් එක් තොටුපලවල් හරහා පැමිණි හා පිටත් වූ පුද්ගලයින් සංඛ්‍යාව - 2025






## ශ්‍රී ලංකාවට පැමිණි හා පිට වූ ශ්‍රී ලාංකිකයන් හා විදේශිකයන් සංඛ්‍යාව මාසිකව - 2025

| මාසය | පැමිණීම | | පිටවීම | |
|---|---|---|---|---|
| | දේශීය | විදේශීය | දේශීය | විදේශීය |
| ජනවාරි | 127,663 | 276,369 | 131,652 | 296,048 |
| පෙබරවාරි | 105,220 | 260,078 | 125,920 | 267,226 |
| මාර්තු | 127,124 | 247,202 | 126,183 | 264,970 |
| අප්‍රේල් | 150,968 | 195,902 | 144,074 | 222,015 |
| මැයි | 134,567 | 153,283 | 136,995 | 170,907 |
| ජූනි | 140,818 | 159,358 | 121,862 | 140,198 |
| ජූලි | 156,415 | 227,509 | 139,865 | 189,323 |
| අගෝස්තු | 142,985 | 224,134 | 166,266 | 261,132 |
| සැප්තැම්බර් | 125,278 | 180,345 | 168,637 | 189,738 |
| ඔක්තෝබර් | 127,295 | 189,208 | 142,393 | 186,260 |
| නොවැම්බර් | 142,684 | 238,190 | 139,971 | 216,368 |
| දෙසැම්බර් | 158,320 | 288,907 | 144,224 | 233,786 |
| එකතුව | 1,639,337 | 2,640,485 | 1,688,042 | 2,637,971 |

## ශ්‍රී ලංකාවට පැමිණි ශ්‍රී ලාංකිකයන් හා විදේශිකයන් සංඛ්‍යාව මාසිකව - 2025



## ශ්‍රී ලංකාවෙන් පිටවූ ශ්‍රී ලාංකිකයන් හා විදේශිකයන් සංඛ්‍යාව මාසිකව - 2025




| | ජනවාරි | පෙබරවාරි | මාර්තු | අප්‍රේල් | මැයි | ජූනි | ජූලි | අගෝස්තු | සැප්තැම්බර් | ඔක්තෝබර් | නොවැම්බර් | දෙසැම්බර් |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ශ්‍රී ලාංකීය | 131652 | 125920 | 126183 | 144074 | 136995 | 121862 | 139865 | 166266 | 168637 | 142393 | 139971 | 144224 |
| විදේශීය | 296048 | 267226 | 264970 | 222015 | 170907 | 140198 | 189323 | 261132 | 189738 | 186260 | 216368 | 233786 |

## ශ්‍රී ලංකාවට පැමිණි විදේශිකයන් සංඛ්‍යාව කලාප අනුව - 2025

| | |
|---|---|
| අප්‍රිකාව | 24,973 |
| ආසියාව | 1,096,409 |
| ඕස්ට්‍රේලියාව | 161,705 |
| යුරෝපය | 1,210,469 |
| උතුරු ඇමරිකාව | 139,538 |
| දකුණු ඇමරිකාව | 5,951 |
| හඳුනා නොගත් | 1,440 |



## 2.1.4 විමර්ශන අංශය

1948 අංක 20 දරණ ආගාමික හා විගාමික පනත හා ඒ යටතේ පනවන ලද 1956 රෙගුලාසි සහ ජාත්‍යන්තර සම්මුතීන්වලට අනුකූල නොවන හා රටෙහි ආරක්ෂාවට තර්ජනයක් වන තැනැත්තන්, ශ්‍රී ලංකාවට ඇතුළුවීමට පෙර, ඇතුළුවන විට හා එහි රැඳී සිටින විට හඳුනාගැනීම, ලංකාව තුළ දී ඔවුන්ගේ ක්‍රියාකාරකම් අධීක්ෂණය කිරීම, ආගාමික හා විගාමික නීති උල්ලංඝණය කරමින් රැඳී සිටින අයවලුන් අත්අඩංගුවට ගැනීම, රඳවා තබාගැනීම, රටින් ඉවත් කිරීම හෝ රටින් පිටුවහල් කිරීම සඳහා අවශ්‍ය විමර්ශන කටයුතු මෙහෙයවීම, ඉහත වැරැදි වැළැක්වීමට සක්‍රීය ප්‍රවේශයකින් කටයුතු කිරීම, ඒ හා සම්බන්ධ නීතිය බලාත්මක කිරීම මෙම අංශය මඟින් සිදුකරනු ලැබේ.

**2.6 වගුව : 2025 වසරේ විමර්ශන ක්‍රියාවලින් හරහා විමර්ශනයට ලක් කළ සමස්ථ විදේශිකයන් සංඛ්‍යාව**

| මාසය | ක්ෂේත්‍ර ආවේක්ෂණය | දුරස්ථ ආවේක්ෂණය | පරීක්ෂා කළ මුළු සංඛ්‍යාව | වැඩිදුර විමර්ශන සඳහා යොමු කළ සංඛ්‍යාව |
|---|---|---|---|---|
| ජනවාරි | 41 | 129 | 170 | 39 |
| පෙබරවාරි | 45 | 104 | 149 | 37 |
| මාර්තු | 171 | 110 | 281 | 108 |
| අප්‍රේල් | 185 | 94 | 279 | 117 |
| මැයි | 121 | 103 | 224 | 90 |
| ජූනි | 56 | 109 | 165 | 51 |
| ජූලි | 248 | 125 | 373 | 245 |
| අගෝස්තු | 60 | 117 | 177 | 43 |
| සැප්තැම්බර් | 84 | 150 | 234 | 84 |
| ඔක්තෝම්බර් | 98 | 195 | 293 | 87 |
| නොවැම්බර් | 31 | 126 | 157 | 22 |
| දෙසැම්බර් | 56 | 172 | 228 | 56 |
| එකතුව | 1,196 | 1,534 | 2,730 | 979 |

**විමර්ශන අංශය විසින් වාර්ෂිකව සිදු කළ සමස්ථ විමර්ශන සංඛ්‍යාව (2018-2025)**



» 2025 වර්ෂයට අදාළව රැඳවුම් නියෝග ලැබූ විදේශිකයන් 928 දෙනෙකු මිරිහාන හා වැලිසර රැඳවුම් මධ්‍යස්ථානවලට ඇතුළත් කළ අතර, ඒ අතුරින් රැඳවියන් 735 දෙනෙකු ඉවත් කිරීමේ හා පිටුවහල් කිරීමේ නියෝග මත මෙරටින් ඉවත් කර ඇති අතර, විමර්ශන කටයුතු මෙහෙයවූ සෙසු විදේශික-යන්ගෙන් 279 දෙනෙකු මෙරටින් ඉවත් වීමේ දැනුම් දීම් මත වශයෙන්, සමස්ථ විදේශිකයන් 1014 දෙනෙකු මෙම වර්ෂය තුළ මෙරටින් ඉවත් කර ඇත.

**2.7 වගුව : 2025 වසරේ විමර්ශන ක්‍රියාවලින් හරහා විමර්ශනයට ලක් කළ සමස්ථ විදේශිකයන් සංඛ්‍යාව**

| ජාතිකත්වය | ඉවත් කිරීමේ නියෝග නිකුත් කිරීම් හා පිටුවහල් කිරීම් | ඉවත් වීමට දැනුම් දීම් | සමස්ථ ඉවත් කිරීම් |
|---|---|---|---|
| බංගලාදේශ | 160 | 30 | 190 |
| චීන | 144 | - | 144 |
| ඉන්දියන් | 323 | 233 | 556 |
| මැලේසියානු | 1 | 1 | 2 |
| යුක්‍රේන | 4 | - | 4 |
| ඇමරිකානු | 1 | - | 1 |
| මැඩගස්කර් | 7 | - | 7 |
| තායිලන්ත | 9 | - | 9 |
| ඉරාන | 3 | - | 3 |
| මාලදිවයින | - | 3 | 3 |
| කොලොම්බියානු | 1 | - | 1 |
| නේපාල | - | 1 | 1 |
| බ්‍රිතාන්‍ය | 2 | 2 | 4 |
| ප්‍රංශ | 1 | - | 1 |
| පාකිස්ථාන | 16 | 5 | 21 |
| පිලිපින | 4 | - | 4 |
| රුසියානු | 12 | - | 12 |
| වියට්නාම | 18 | - | 18 |
| ඉතාලි | 1 | - | 1 |
| ජපන් | 2 | - | 2 |
| කෙන්යා | 1 | - | 1 |
| නයිජීරියන් | 5 | - | 5 |
| ඕස්ට්‍රේලියානු | 3 | 1 | 4 |
| බ්‍රසීල | 1 | - | 1 |
| ඉරාක | 1 | - | 1 |
| ලිතුවේනියා | 1 | - | 1 |
| කසකස්ථානය | 1 | - | 1 |
| කොරියානු | 1 | - | 1 |
| මොරොක්කෝව | 1 | - | 1 |
| නේදර්ලන්තය | 1 | 1 | 2 |
| ඊශ්‍රායල | 5 | 1 | 6 |
| සෝමාලියානු | 3 | - | 3 |
| යේමන | 2 | - | 2 |
| කැනේඩියානු | - | 1 | 1 |
| මුළු එකතුව | 735 | 279 | 1,014 |

## 01. රැඳවියන් රඳවා තැබීමේ මධ්‍යස්ථාන (DETENTION CENTER)

» ආගාමික හා විගාමික පනත උල්ලංඝනය කරමින් ශ්‍රී ලංකාව තුළ රැඳී සිටි විදේශිකයන් සහ ශ්‍රී ලංකාව තුළ විවිධ අපරාධ සම්බන්ධයෙන් අත්අඩංගුවට පත්ව, නීතිමය කටයුතු අවසන් වූ පසු මෙරටින් ඉවත් කිරීමට නියමිත විදේශිකයන් රඳවා තබා ගැනීම, ඉවත් කරන තෙක් ඔවුන්ගේ මූලික අවශ්‍යතා සැපයීම සහ අවශ්‍ය වෛද්‍ය ප්‍රතිකාර සඳහා යොමු කිරීම මෙම රැඳවුම් මධ්‍යස්ථාන මගින් සිදු කරයි.

» තවද, රැඳවියන් සඳහා වෛද්‍ය ප්‍රතිකාර ලබාගැනීමට අවශ්‍යතා මතු වූ විට රාජකාරියේ නිරත නිලධාරීන් විසින් එම රැඳවියන් රෝහල් කරා රැගෙන යාම, රෝහල්ගත කිරීමට අවශ්‍ය අවස්ථාවල දී රෝහල්ගත කිරීම සහ අවශ්‍ය අවස්ථාවල දී වෛද්‍ය කඳවුරු පැවැත්වීම මෙන්ම අධිකරණය වෙත ඉදිරිපත් කිරීම ද සිදු කරනු ලබයි.

දැනට මෙම දෙපාර්තමේන්තුව යටතේ පරිපාලනය වන රැදවුම් මධ්‍යස්ථාන දෙකකි.

- ▲ මිරිහාන රඳවා තැබීමේ මධ්‍යස්ථානය
- ▲ වැලිසර රඳවා තැබීමේ මධ්‍යස්ථානය

**2.8 වගුව : රඳවා තැබීමේ මධ්‍යස්ථානවල රඳවා සිටි රැඳවියන් ගණන**

| රඳවා තැබීමේ මධ්‍යස්ථානය | වසර තුළ රඳවා සිටි රැඳවියන් ගණන | | | 2025/12/31 දිනට රඳවා සිටි රැඳවියන් ගණන | | |
|---|---|---|---|---|---|---|
| | ගැහැණු | පිරිමි | එකතුව | ගැහැණු | පිරිමි | එකතුව |
| මිරිහාන | - | - | - | - | - | - |
| වැලිසර | 94 | 834 | 928 | 14 | 86 | 100 |

## 02. තැනැත්තන් වෙළඳාම තුරන් කිරීමේ ජාතික සම්පත් මධ්‍යස්ථානය

මෙම මධ්‍යස්ථානය ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ විමර්ශන අංශය යටතේ ක්‍රියාත්මක වන ඒකකයක් වන අතර ඒ මඟින්,

» රට තුළ සිටින විදේශිකයන්ට සහ දේශසීමා හරහා සිදුවන තැනැත්තන් වෙළඳාමට සම්බන්ධ සිදුවීම් හඳුනාගෙන ඒවා වැළැක්වීම සඳහා විමර්ශන අංශයට සහය ලබා දීම

» ආගමන හා විගමන නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම

» ඉහත සිදුවීම් විමර්ශනයට සම්බන්ධ වන අනෙකුත් ආයතන වන අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව, අධිකරණ අමාත්‍යාංශය සහ ජාතික වශයෙන් පිහිටුවා, ආරක්ෂක අමාත්‍යාංශය මගින් මෙහෙයවන, තැනැත්තන් වෙළඳාම වැළක්වීමේ කාර්ය සාධන බලකාය වෙත කරුණු යාවත්කාලීන කිරීම සහ අවශ්‍ය සහ-සම්බන්ධීකරණය පවත්වාගෙන යාම

» ඇමෙරිකානු රාජ්‍ය දෙපාර්තමේන්තුව මගින් සකසන "තැනැත්තන් වෙළඳාම පිළිබඳ වාර්තාව" සඳහා ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ වාර්ෂිකව සිදු කල වැඩසටහන්වල තොරතුරු ආරක්ෂක අමාත්‍යාංශය හරහා දැනුවත් කිරීම

» ගුවන් තොටුපලෙහි ආගමන හා විගමන අංශය සහ විශේෂයෙන් දේශසීමා ආවේක්ෂණ ඒකකය සමග සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම

» විදේශ ආගමන හා විගමන නිලධාරීන් සමග බුද්ධි තොරතුරු හුවමාරුව, රාජ්‍ය නොවන සංවිධාන සහ ජාත්‍යන්තර සංවිධාන සමග තැනැත්තන් වෙළඳාම වැළැක්වීම සම්බන්ධයෙන් සම්බන්ධීකරණ කටයුතු මෙම අංශය මගින් සිදු කෙරේ.

**වාර්ෂිකව සරණාගත තත්ත්වය සඳහා ඉල්ලුම් කළ සහ සරණාගත තත්ත්වය ලබා මෙරට රැඳී සිටි සමස්ථ සංඛ්‍යාව (2014 - 2025)**




## 03. අවදානම් තක්සේරු මධ්‍යස්ථානය (RISK ASSESSMENT CENTER)

» 2019 මැයි මස විමර්ශන අංශය යටතේ පිහිටුවන ලද මෙම මධ්‍යස්ථානය මඟින් ප්‍රත්‍යන්ත පාලන කටයුතුවලට අදාළ හා ඊට අනුශාංගික බුද්ධිමය තොරතුරු එක්රැස් කිරීම, සකස් කිරීම, සැලසුම් කිරීම හා විශ්ලේෂණය කිරීම තුළින් ශ්‍රී ලංකාවට ඇතුළුවීමට බලාපොරොත්තු වන, රටට ඇතුළු වන, රට තුළ රැඳී සිටින හා ශ්‍රී ලංකාවෙන් පිටවන අවදානම් සහගත මඟීන් හා ප්‍රවණතා කල්තියා හඳුනා ගැනීම සිදු කරනු ලබයි. එමඟින් ඔවුන් රටට පැමිණීම හෝ පිටවීම වළක්වාලීම සහ එකී තොරතුරු ආරක්ෂාවට සම්බන්ධ අනෙකුත් ආයතන සමඟ හුවමාරු කරගැනීම අවදානම් තක්සේරු මධ්‍යස්ථානයේ කාර්යයන් වේ. ඒ අනුව, කෙටිකාලීන හා දීර්ඝ කාලීන ආගමන විගමන ආරක්ෂක හා විමර්ශන ක්‍රම උපායන් සැකසීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා මෙම දත්ත ඉතා ඵලදායීව යොදාගනු ලැබේ.

**2.9 වගුව : අවදානම් තක්සේරු මධ්‍යස්ථානය මඟින් 2025 වර්ෂයට අදාළව සිදු කරන ලද අවදානම් තක්සේරුකරණය**

| ජාතිකත්වය | ඉල්ලුම් කළ මුළු ගණන | පරීක්ෂා කරන ලද සංඛ්‍යාව (RAC HITS) | වීසා ලබානොදීමට නිර්දේශ කිරීම |
|---|---|---|---|
| පාකිස්ථාන | 56,312 | 13,680 | 192 |
| නේපාල | 7,892 | 3,065 | 394 |
| ඇෆ්ගනිස්ථාන | 497 | 488 | 434 |
| මැඩගස්කර් | 211 | 92 | 12 |
| කොලොම්බියා | 877 | 315 | 40 |
| එකතුව | 65,789 | 17,640 | 1,072 |

» 2025 වර්ෂයට අදාළව ඉදිරිපත් වූ වීසා අයඳුම්පත් 65,789ක් අතරින් වීසා අයඳුම්පත් 17,640ක් අවදානම් තක්සේරු මධ්‍යස්ථානය මඟින් පරීක්ෂාවට ලක් කර ඇති අතර, ඒ අතුරින් අවදානම් සහගත වීසා අයඳුම්පත් 1,072ක් වීසා ලබා නොදීමට නිර්දේශ කර වීසා අංශයට යොමුකර ඇත.

### 04. දේශසීමා ආවේක්ෂණ ඒකකය (BORDER SURVEIALLANCE UNIT)

» සංවිධානාත්මක අපරාධ ලෙස සැලකෙන මිනිස් වෙළඳාම හා මිනිස් ජාවාරම අවම කිරීම සහ වීසා අවභාවිතාවන් පිළිබඳ විමර්ශනයන්ට අවශ්‍ය සහය ලබා දීමේ අරමුණු ඇතිව 2019 ජූලි මස සිට බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ කේන්ද්‍ර කරගනිමින් දේශසීමා ආවේක්ෂණ ඒකකය ස්ථාපිත කර ඇත.

**2.10 වගුව : 2025 වර්ෂයේ දී දේශසීමා ආවේක්ෂණ ඒකකය හරහා අධීක්ෂණයට ලක් වූ සංඛ්‍යාව**

| දත්ත පද්ධතිය | සංඛ්‍යාව |
|---|---|
| ව්‍යාජ ලේඛන භාවිත හඳුනා ගැනීම් | 197 |
| ක්‍රියාකාරකම් වාර්තා | 117 |
| අක්‍රමවත් සංක්‍රමණයන් | 76 |
| මගීන් සහ ලේඛන යොමු කිරීම් | 2,420 |
| එකතුව | 2,810 |

**2.11 වගුව : 2025 වර්ෂයට අදාළව හඳුනාගත් ව්‍යාජ ගුවන් ගමන් බලපත්‍ර**

| දත්ත පද්ධතිය | සංඛ්‍යාව |
|---|---|
| බ්‍රසීලය | 01 |
| කැනඩාව | 01 |
| එක්සත් අරාබි එමීර් රාජ්‍ය | 01 |
| මියන්මාරය | 01 |
| ඉන්දුනීසියාව | 01 |
| ගහනාව | 01 |
| ස්පාඤ්ඤය | 02 |
| කසකස්ථානය | 02 |
| බ්‍රිතාන්‍ය | 03 |
| ඉතාලිය | 03 |
| ප්‍රංශය | 04 |
| මැලේසියාව | 04 |
| ඉන්දියාව | 05 |
| චීනය | 10 |
| ශ්‍රී ලංකාව | 28 |
| එකතුව | 67 |

**2.12 වගුව : 2025 වර්ෂයට අදාළව හඳුනාගත් ව්‍යාජ වීසා**

| රට | හඳුනාගත් ව්‍යාජ වීසා ගණන |
|---|---|
| බෙල්ජියම | 01 |
| ගෝතමාලාව | 01 |
| ජපානය | 01 |
| ග්‍රීසිය | 01 |
| මැලේසියාව | 01 |
| සර්බියාව | 02 |
| පෝලන්තය | 02 |
| ඉරානය | 04 |
| උතුරු මැසඩෝනියාව | 05 |
| ප්‍රංශය | 05 |
| බ්‍රිතාන්‍ය | 08 |
| කැනඩාව | 16 |
| ඉතාලිය | 18 |
| එකතුව | 66 |

## 2025 වර්ෂයේ හඳුනාගත් සංක්‍රමණ ප්‍රවණතා

- සංචාරක වීසා මත මෙරටට පැමිණෙන චීන ජාතිකයන් මාර්ගගත විවිධ ජාවාරම්වල යෙදීමේ ප්‍රවණතාවක් හඳුනාගෙන ඇත.
- පාකිස්ථානුවන්, ශ්‍රී ලංකාව හරහා ඊජිප්තුවට හා ලිබියාවට ඇතුළු වී මධ්‍යධරණී මුහුද හරහා යුරෝපයට සංක්‍රමණය වීමේ නව සංක්‍රමණ ප්‍රවණතාවක් හඳුනාගෙන ඇත.
- ශ්‍රී ලාංකිකයන් පැනමා මුහුදු නාවික ලේඛන (Panama CDC) භාවිත කරමින් නාවිකයින් ලෙස පෙනී සිට බ්‍රිතාන්‍ය සංක්‍රමණය වීමේ අවස්ථා හඳුනාගෙන ඇත.
- නව දිල්ලිය නිකුත් කරන ග්‍රීසියට අදාළ වීසා ව්‍යාජ ලෙස යොදා ගනිමින් ශ්‍රී ලාංකික සංචාරකයින් යුරෝපයට සංක්‍රමණය වීමට උත්සහ කිරීම.
- රුමේනියානු කාන්තාවන් ව්‍යාජ විවාහකයන් ලෙස පෙනී සිටීමට ශ්‍රී ලාංකිකයන්ට සහාය දක්වමින්, යුරෝපානු වීසා යටතේ විශේෂයෙන් බ්‍රිතාන්‍යයට සංක්‍රමණය වීමේ අවස්ථා හඳුනා ගැනීම.
- නේපාල කාන්තාවන් විසින් මැදපෙරදිග නීතිවිරෝධී රැකියා කිරීම උදෙසා ශ්‍රී ලංකාව හරහා කුවේට් වෙත සංක්‍රමණය වීම.
- ශ්‍රී ලාංකිකයන් මාර්ගගත රැකියා බලාපොරොත්තුවෙන් මියන්මාරයට හා කාම්බෝජයට සංක්‍රමණය වීම හා මිනිස් ජාවාරම්වලට ගොදුරු වීම, විශේෂයෙන්ම සයිබර් අපරාධ මධ්‍යස්ථානවල ග්‍රහණයට නතු වීම.

## 2.1.5 ප්‍රතිපත්ති, සංවර්ධන හා ප්‍රතිසංස්කරණ අංශය

මෙම අංශය යටතේ ප්‍රතිපත්ති, සංවර්ධන හා ප්‍රතිසංස්කරණ ශාඛාව, ඉන්දු ලංකා පුරවැසි ශාඛාව හා නීති ශාඛාව යන ශාඛාවන් ක්‍රියාත්මක වන අතර අධීක්ෂණය පාලක (ප්‍රතිපත්ති, සංවර්ධන හා ප්‍රතිසංස්කරණ)/ නියෝජ්‍ය කොමසාරිස් (ඉන්දු-ලංකා) මඟිනි.

### 2.1.5.1 ප්‍රතිපත්ති, සංවර්ධන හා ප්‍රතිසංස්කරණ ශාඛාව

ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ සංවර්ධන හා ප්‍රතිපත්ති සම්පාදන කටයුතු වඩාත් සැලසුම් සහගතව හා වඩා විධිමත් අයුරින් ක්‍රියාත්මක කිරීමේ අරමුණින් මෙම ශාඛාව ස්ථාපිත කර ඇත. මෙම ශාඛාව මගින් ඉටු කරනු ලබන ප්‍රධාන කාර්යයන්,

01. දෙපාර්තමේන්තුවේ මූලික කාර්යයන් ඉටුකිරීමේදී අදාල වන ප්‍රතිපත්ති හා සැලසුම් සකස් කිරීම
02. දෙපාර්තමේන්තුවට අදාල නීති, අණ පනත් සංශෝධනය
03. අභ්‍යන්තර චක්‍රලේඛ හා කාර්ය පටිපාටි සකස් කිරීම හා නිකුත් කිරීම මෙහෙයුම් අත්පොත් සකස් කිරීම හා යාවත්කාලීන කිරීම
04. වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම (Action Plan) සකස් කිරීම හා එය ක්‍රියාවට නැගීමට අදාල කටයුතු කිරීම
05. පසුගිය වර්ෂයට අදාල කාර්ය සාධන වාර්තාව සකස් කිරීම
06. අනෙකුත් ආයතන වලට මාසිකව, කාර්තු වශයෙන් හා වාර්ෂිකව යැවිය යුතු ප්‍රගති වාර්තා සකස් කිරීම හා නියමිත දිනට එම වාර්තා අදාල ආයතන වෙත යොමු කිරීම
07. රේඛීය අමාත්‍යාංශය හා අනෙකුත් ආයතන සමඟ ප්‍රතිපත්තිමය කටයුතු වලට අදාල රාජකාරි සම්බන්ධීකරණය කිරීම
08. දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවය අනුව අමාත්‍ය මණ්ඩල සංදේශ සකස් කර, ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගැනීමට කටයුතු කිරීම හා වෙනත් අමාත්‍යාංශ වලින් ඉදිරිපත් කරන අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ ලබා දීමට කටයුතු කිරීම
09. පාර්ලිමේන්තුවේ වාචික පිළිතුරු අපේක්ෂාවෙන් යොමු කරනු ලබන ප්‍රශ්න සඳහා පිළිතුරු සකස් කිරීම
10. දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරනු ලබන විශේෂිත ව්‍යාපෘති සඳහා සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම හා වාර්ෂිකව සිදු කරන ප්‍රාග්ධන ව්‍යාපෘති වල ප්‍රගති සමාලෝචනය කිරීම, සම්බන්ධීකරණය, මෙහෙයවීම හා අධීක්ෂණය කිරීම

### 2.1.5.2 ඉන්දු ලංකා පුරවැසි ශාඛාව

1949 අංක 03 දරන ඉන්දියානු හා පාකිස්ථානු පදිංචිකරුවන්ගේ පුරවැසිභාවය පිළිබඳ පනත, 1967 අංක 14 දරන ඉන්දු ලංකා ගිවිසුම ක්‍රියාවට නැංවීමේ පනත, 1988 අංක 39 දරන ආදේශිකයන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ පනත හා 2003 අංක 35 දරන ඉන්දියානු සම්භවය ඇති තැනැත්තන්ට පුරවැසිභාවය ප්‍රදා-නය කිරීමේ පනත යන පනත් ප්‍රකාරව සුදුසුකම් සපුරන තැනැත්තන්ට ශ්‍රී ලංකාවේ පුරවැසිභාවය ප්‍රදානය කිරීම හා ඊට ආනුශංගික කාර්යයන් ඉටු කිරීම මෙම ශාඛාවේ කාර්යභාරය වේ.

**2.13 වගුව : ලියාපදිංචිය පිළිබඳ තොරතුරු සනාථ කිරීමේ ලිපි නිකුත් කිරීම 2021- 2025**

| පනත | 2021 | 2022 | 2023 | 2024 | 2025 |
|---|---|---|---|---|---|
| 1949 අංක 03 | 29 | 148 | 297 | 66 | 43 |
| 1967 අංක 14 | 25 | 158 | 294 | 64 | 45 |
| 1988 අංක 39 | 14 | 52 | 182 | 78 | 19 |
| 2003 අංක 35 | - | 15 | 07 | 03 | 05 |

**2.14 වගුව : 2025 වර්ෂයේ ක්‍රියාත්මක වූ මූලික මුලධන ව්‍යාපෘතීන්වල මූල්‍ය හා භෞතික ප්‍රගතිය**

| අ.අ | ව්‍යාපෘතිය | ප්‍රතිපාදනය | මූල්‍ය වියදම | මූල්‍ය ප්‍රගතිය | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|---|
| 1 | Reconstruction of Vavuniya Holiday Resort | 4 | - | 0% | 5% |
| 2 | Reconstruction of Office Building at Colombo Port | 4.2 | 3.74 | 90% | 100% |
| 3 | Reconstruction of Restroom PlatformKatunayake | 1.1 | 1.1 | 100% | 100% |
| 4 | Construction of a Restroom for Male Authorized Officers at Welisara Foreigner Detention Centre | 3.5 | 3.38 | 95% | 100% |
| 5 | Construction of a Restroom for Female Authorized Officers at Welisara Foreigner Detention Centre | 3.5 | 3.38 | 95% | 100% |
| 6 | Preparation of Storage Facilities for e-Passports | 6 | - | 0% | 10% |
| 7 | Fencing and Motor Bike Park | 2 | 1.61 | 80% | 100% |
| 8 | Internal arrangements for proposed passport office Jaffna | 5.9 | 6.85 | 100% | 100% |
| 9 | Staff toilets & Public toilets for proposed passport office Jaffna | 2.1 | 2.15 | 100% | 100% |
| 10 | Shifting branch for proposed passport office Jaffna | 0.12 | 0.14 | 100% | 100% |
| 11 | Establishment of Suhurupaya Police post | 1 | 0.81 | 81% | 100% |
| 12 | Patition work at piyasa | 0.8 | - | 0% | 100% |
| 13 | Waiting Canopy for proposed passport office Jaffna | 6.1 | 5.34 | 87% | 100% |
| 14 | Renovation of Porch Area in Fourth Storied Building for proposed passport office Jaffna | 2.7 | - | 0% | 0% |
| 15 | Establishment of the office of the Aditional Controller General | 1 | 1 | 100% | 100% |
| 16 | Proposed Renovation of interior of Terminal "D" of passport Division (Step 01 partition work) | 6.14 | - | 0% | 100% |
| 17 | Proposed Renovation of interior of Terminal "D" of passport Division (Step 02 Electrical and Finishing Work) | 5.3 | - | 0% | 100% |
| 18 | Improvement of Plant Machinery and Equipment | 5 | - | 0% | 0% |
| 19 | Improvement of Vehicles | 24.61 | 24.61 | 100% | 100% |
| 20 | Purchasing Office Furniture & Equipment for office requirement | 9.1 | 7.12 | 78% | 100% |
| 21 | Computer & Devies (Without pp printers) for proposed passport office Jaffna | 10.6 | 10.97 | 100% | 100% |

| | | | | | |
|---|---|---|---|---|---|
| 22 | Computer & Devies for Citizen branch & other branches | 4.4 | 0.34 | 8% | 100% |
| 23 | Estimate for Air Conditioners for proposed passport office Jaffna | 3 | 2.91 | 97% | 100% |
| 24 | Estimate for Air Conditioners Vauniya Regional office | 3 | 2.17 | 72% | 100% |
| 25 | BIA Arrival Networking | 30 | - | 0% | 10% |
| 26 | 12 Nos of Finger print scanners | 6 | - | 0% | 50% |
| 27 | Server space upgrade | 35 | 9.4 | 26% | 100% |
| 28 | Purchasing of 14 Printers and 4 photo copy machines | 2.5 | 3.43 | 100% | 100% |
| 29 | 04 Display Units(10-50" TV's & 17 NUC Computers | 2 | - | 0% | 50% |
| 30 | Purchasing of 9 UPS for Kandy, Galle, Kankesanthurai, Palaly, Matara, Vavuniya and Colombo Harbour | 40 | - | 0% | 10% |
| 31 | CCTV Networking | 5 | 5.3 | 100% | 100% |
දිනය : 2026/02/26

K.G.S.P Weerakoon
Chief Accountant
Department of Immigration & Emigration
"Suhurupaya", Sri Subhuthipura Road,
Battaramulla.

40

# කාර්ය සාධන දර්ශක

# 04 පරිච්ඡේදය

ආගමන හා විගමන දෙපාර්තමේන්තුව ජනතාවට සුවිශේෂී සේවාවක් සපයන අතරතුර ශ්‍රී ලංකා රජය වෙනුවෙන් රටට ආදායම් උත්පාදනය කිරීමේ කාර්යභාරයෙහි නිරත වී සිටින ප්‍රධාන රාජ්‍ය ආයතනයකි. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්ය සාධන දර්ශක වනුයේ,

**01.** එක්දින සේවාව යටතේ ලැබුනු ගමන් බලපත්‍ර අයදුම්පත් සංඛ්‍යාවට අනුව දිනක් තුල නිකුත් කල ගමන් බලපත්‍ර සංඛ්‍යාවේ ප්‍රතිශතය

**02.** සාමාන්‍ය සේවාව යටතේ ලැබුනු ගමන් බලපත්‍ර අයදුම්පත් සංඛ්‍යාවට අනුව නිකුත් කල ගමන් බලපත්‍ර සංඛ්‍යාවේ ප්‍රතිශතය

**03.** මාර්ගස්ථ ක්‍රමය යටතේ ලැබුනු ගමන්බලපත්‍ර අයදුම්පත් සංඛ්‍යාවට අනුව නිකුත් කල ගමන් බලපත්‍ර සංඛ්‍යාවේ ප්‍රතිශතය

**04.** ද්විත්ව පුරවැසිභාවය ලබා ගැනීම සඳහා ලද අයදුම්පත් සංඛ්‍යාවට අනුව නිකුත් කල ද්විත්ව පුරවැසි සහතිකපත් සංඛ්‍යාවේ ප්‍රතිශතය

**05.** ඉ - සංචරණ අනුමැතිය ලබා ගැනීම සඳහා ඉල්ලුම් කල අයදුම්පත් සංඛ්‍යාවට අනුව ඉ - සංචරණ අනුමැතිය ලබා දුන් සංඛ්‍යාවේ ප්‍රතිශතය

**06.** වාර්ෂික ඉලක්කයන්ට අනුව ආදායම ඉපැයීමේ ප්‍රතිශතය

**01**

එක්දින සේවාව යටතේ ලැබුණු අයදුම්පත් සංඛ්‍යාව **516,574** කින් වර්ෂය තුළදී නිකුත් කල ගමන් බලපත්‍ර සංඛ්‍යාව **516,870** ක් වේ. එනම් මෙම වසර තුළ එක්දින සේවාව යටතේ ලැබුණු අයදුම්පත් සංඛ්‍යාවට අනුව ගමන් බලපත්‍ර නිකුත් කිරීමේ ප්‍රතිශතය **100%** කි.

**02**

2025 වර්ෂය තුල සාමාන්‍ය සේවාව යටතේ ලැබුණු අයදුම්පත් සංඛ්‍යාව **133,557**ක් වන අතර වර්ෂය තුළදී නිකුත් කල ගමන් බලපත්‍ර සංඛ්‍යාව **188,133** ක් වේ. එනම් මෙම වසර තුළ සාමාන්‍ය සේවාව යටතේ ලැබුණු අයදුම්පත් සංඛ්‍යාවට අනුව ගමන් බලපත්‍ර නිකුත් කිරීමේ ප්‍රතිශතය **100%** කි.

**03**

2025 වර්ෂය තුල මාර්ගස්ථ ක්‍රමය යටතේ යටතේ ලැබුණු අයදුම්පත් සංඛ්‍යාව **14,287** වන අතර වර්ෂය තුළදී නිකුත් කල සමස්ථ ගමන් බලපත්‍ර සංඛ්‍යාව **36,096** වේ. එනම් මෙම වසර තුළ මාර්ගස්ථ සේවාව යටතේ ලැබුණු අයදුම්පත් සංඛ්‍යාවට අනුව ගමන් බලපත්‍ර නිකුත් කිරීමේ ප්‍රතිශතය **100%** කි.

**04**

ද්විත්ව පුරවැසිභාවය ලබා ගැනීම සඳහා ලද අයදුම්පත් **10,248** ක් අතුරින් 2025 වර්ෂයේ **8,132** දෙනෙකුට ද්විත්ව පුරවැසිභාවය ලබාදීමට කටයුතු කරන ලදී. එනම් ලැබුණු අයදුම්පත් සංඛ්‍යාවට අනුව ද්විත්ව පුරවැසිභාවය ලබාදීමේ ප්‍රතිශතය **79.35%** කි.

**05**

ඉ - සංචරණ අනුමැතිය සඳහා ලද අයදුම්පත් **2,306,554** ක් අතුරින් 2025 වර්ෂයේ **2,305,352** දෙනෙකුට ඉ - සංචරණ අනුමැතිය ලබාදීමට කටයුතු කරන ලදී එනම් ලැබුණු අයදුම්පත් සංඛ්‍යාවට අනුව ඉ - සංචරණ අනුමැතිය ලබාදීමේ ප්‍රතිශතය **99.93%** කි.

**06**

2025 වර්ෂයේ මුල පැවති ඇස්තමේන්තුගත ආදායම රුපියල් බිලියන **38.0** ක් වන අතර 2025 වර්ෂයේ සත්‍ය වශයෙන් උපයන ලද මුළු ආදායම රුපියල් බිලියන **44.88** ක් විය. එය **118.10%** ක ආදායම් ඉපයීමේ කාර්ය සාධනයකි.

## ප්‍රධාන කාර්ය සාධන දර්ශක - 2025

| | විශේෂිත කාර්ය සාධන දර්ශක | අපේක්ෂිත නිමවුමේ ප්‍රතිශතයක් % ලෙස තත්‍ය නිමවුම | | |
|---|---|---|---|---|
| | | 90%-100% | 75%-89% | 50%-74% |
| | දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යසාධන දර්ශක | | | |
| 1 | එක්දින සේවාව යටතේ ලැබුනු ගමන් බලපත්‍ර අයදුම්පත් සංඛ්‍යාව අනුව නිකුත් කල ගමන් බලපත්‍ර සංඛ්‍යාව | √ | | |
| 2 | සාමාන්‍ය සේවාව යටතේ ලැබුනු ගමන් බලපත්‍ර අයදුම්පත් සංඛ්‍යා-වට අනුව නිකුත් කල ගමන් බලපත්‍ර සංඛ්‍යාවේ ප්‍රතිශතය | √ | | |
| 3 | මාර්ගස්ථ ක්‍රමය යටතේ ලැබුනු ගමන්බලපත්‍ර අයදුම්පත් සංඛ්‍යාවට අනුව නිකුත් කල ගමන් බලපත්‍ර සංඛ්‍යාවේ ප්‍රතිශතය | √ | | |
| 4 | ද්විත්ව පුරවැසිභාවය ලබා ගැනීම සඳහා ලද අයදුම්පත් සංඛ්‍යාව අනුව නිකුත් කල ද්විත්ව පුරවැසි සහතික සංඛ්‍යාව | | √ | |
| 5 | ඉ - සංචරණ අනුමැතියලබා ගැනීම සඳහා ඉල්ලුම් කල අයදුම්පත් සංඛ්‍යාව අනුව අනුමැතිය ලබා දුන් සංඛ්‍යාව | √ | | |
| 6 | වාර්ෂික ඉලක්කයන්ට අනුව ආදායම ඉපැයීමේ ප්‍රතිශතය | √ | | |
| | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව කාර්යසාධන දර්ශක | | | |
| 1 | තොටුපල නවීකරණය කිරීම | | √ | |
| 2 | යන්ත්‍රෝපකරණ හා උපකරණ වැඩිදියුණු කිරීම | | √ | |
| 3 | වාහන නඩත්තු කිරීම | | √ | |
| 4 | කාර්යාලයේ අවශ්‍යතා අනුව කාර්යාල ගෘහභාණ්ඩ හා උපකරණ මිලදී ගැනීම | √ | | |
| 5 | ලැමිනේටින් යන්ත්‍ර 12ක් මිලදී ගැනීම | √ | | |
| 6 | ලැප්ටොප් 50ක් මිලදී ගැනීම | √ | | |
| 7 | පරිගණක 75ක් මිලදී ගැනීම | √ | | |
| 8 | ටෝකන් ප්‍රින්ටින් යන්ත්‍ර 5ක් මිලදී ගැනීම | √ | | |
| 9 | Printers මිලදී ගැනීම | √ | | |
| 10 | කාර්යාල උපකරණ මිලදී ගැනීම | √ | | |
| 11 | Note Book 5ක් මිලදී ගැනීම | √ | | |
| 12 | Upgrade of Departure Terminal switch for e-Gate project | √ | | |
| 13 | Upgrade of Network 24 port SEP¬10G switch at BIA | √ | | |
| 14 | Replacing connectivity with SLT Rack switch and data center at BIA | √ | | |
| 15 | Fiber Network Infrastructure for data center and Departure / Arrival Terminal connectivity at BIA | √ | | |
| 16 | Replacement of network swμtch for C¸D and S¸S connection ^24 port Fiber switch& | √ | | |
| 17 | Kaspersky Virus guard | √ | | |
| 18 | Purchasing core switch other switches for Head office data center | √ | | |
| 20 | කටුනායක විවේකාගාරය නවීකරණය කිරීම | √ | | |
| 21 | ප්‍රතිපත්ති අංශය සඳහා ලේඛන කළමනාකරණය කිරීමේ පද්ධතියක් හඳුන්වාදීම | | √ | |
| 22 | Windows License | √ | | |
| 23 | සේවක පුහුණුව | √ | | |
| 24 | හිස් ගමන් බලපත්‍ර 500,000ක් මිලදී ගැනීම | √ | | |
| 25 | විදේශ ගමන් බලපත්‍ර මුද්‍රණය සඳහා අවශ්‍ය පරිභෝජන ද්‍රව්‍ය | √ | | |

# තිරසර සංවර්ධන අරමුණු

# 05 පරිච්ඡේදය

## 5.1 හඳුනාගත් තිරසර සංවර්ධන අරමුණු

| ඉලක්කය / අරමුණු | ඉලක්ක | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|
| | | | 0%-49% | 50%-74% | 75%- 100% |
| තිරසර සංවර්ධන අභිමතාර්ථ අංක 16 - සාමය, යුක්තිය, ශක්තිමත් ආයතන | ත්‍රස්තවාදය හා ප්‍රචණ්ඩත්වය වැළැක්වීමට අදාළ ආයතනික ව්‍යුහය ශක්තිමත් කිරීම හා ඒ සම්බන්ධ අනෙකුත් ආයතන හා සම්බන්ධීකරණයෙන් යුතුව කටයුතු කිරීම | ආගාමික හා විගාමික පනත උල්ලංඝනය කරමින් මෙරට රැඳී සිටින විදේශිකයන් පිළිබඳ සිදු කල විමර්ශනයන් පාදක කොටගෙන රටෙන් ඉවත් කරන ලද විදේශිකයන් සංඛ්‍යාව | | | ✓ |
| | | ජාතික ආරක්ෂාවට තර්ජනයක් විය හැකි අවදානම් පුද්ගලයින් සම්බන්ධයෙන් සිදු කල විමර්ශනයන් පදනම් කරගෙන රටට ඇතුළු වීම වැළැක්වූ විදේශිකයන් සංඛ්‍යාව | | | ✓ |
| | මිනිස් ජාවාරම් හා තැනැත්තන් වෙළඳාම වැළැක්වීම සඳහා ආයතනික ව්‍යුහයක් සැකසීම | තැනැත්තන් වෙළඳාම සම්බන්ධයෙන් සිදු කල විමර්ශන පාදක කොටගෙන හඳුනාග න්නා ලද වින්දිතයන් සඳහා සහන සැලසූ සංඛ්‍යාව | | | ✓ |
| | වගවීමෙන් හා විනිවිදභාවයෙන් යුතුව ජනතාව වෙත ගුණාත්මක හා කාර්යක්ෂම සේවයක් ඉටු කිරීම | 1948 අංක 20 දරණ ආගාමික හා විගාමික පනත උල්ලංඝනය කරමින් මෙරටින් පිටවීමට තැත්කරන පුද්ගලයන් අත්අඩංගුවට ගත් සංඛ්‍යාව | | | ✓ |

## 5.2 තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්ය සාධනය

**01.** 2025 වර්ෂයට අදාළව ක්ෂේත්‍ර ආවේක්ෂණ යටතේ අදාළ ස්ථානීය පරීක්ෂණයන් මඟින් විමර්ශනයට ලක් කළ තැනැත්තන් සංඛ්‍යාව 1,196ක් වන අතර, දුරස්ථ ආවේක්ෂණය යටතේ තැනැත්තන් 1,534 දෙනෙකුගේ තොරතුරු වීසා අංශය හරහා විපරම් ලේඛනයට ඇතුළත් කර ඇත. ඒ අනුව, මෙම වර්ෂය තුළ තැනැත්තන් 2,730 දෙනෙකු විමර්ශනයට ලක් කර ඇති අතර, ඒ අතුරින් තැනැත්තන් 979 දෙනෙකු පිළිබඳ වැඩිදුර විමර්ශන මෙහෙයවා ඇත.

**02.** මෙම වර්ෂයට අදාළව රැඳවුම් නියෝග ලැබූ විදේශිකයන් 928 දෙනෙකු මිරිහාන හා වැලිසර රැඳවුම් මධ්‍යස්ථානවලට ඇතුළත් කළ අතර, ඒ අතුරින් රැඳවියන් 735 දෙනෙකු ඉවත් කිරීමේ හා පිටුවහල් කිරීමේ නියෝග මත මෙරටින් ඉවත් කර ඇති අතර, විමර්ශන කටයුතු මෙහෙයවූ සෙසු විදේශිකයන්ගෙන් 279 දෙනෙකු මෙරටින් ඉවත්වීමේ දැනුම් දීම් මත වශයෙන්, සමස්ථ විදේශිකයන් 1,014 දෙනෙකු මෙම වර්ෂය තුළ මෙරටින් ඉවත් කර ඇත.

**03.** මෙම වර්ෂයේ ඉදිරිපත් වූ වීසා අයදුම්පත් 65,789ක් අතරින් විසා අයඳුම්පත් 17,640ක් අවදානම් තක්සේරු මධ්‍යස්ථානය මඟින් පරීක්ෂාවට ලක් කර ඇති අතර, ඒ අතුරින් අවදානම් සහගත වීසා අයඳුම්පත් 1,072ක් විසා ලබානොදීමට නිර්දේශ කර වීසා අංශයට යොමුකර ඇත.

**04.** මෙම වර්ෂයට අදාළව ව්‍යාජ වීසා හා ගුවන් බලපත්‍ර භාවිතය සම්බන්ධව හඳුනාගත් ගත් සංඛ්‍යාව 197ක් වන අතර අක්‍රමවත් සංක්‍රමණ අවස්ථා 76 ද වාර්තා වී ඇත.

# මානව සම්පත් පැතිකඩ

## 06 පරිච්ඡේදය

දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන මට්ටම ඉහළ නැංවීමට සහ ඉහළ කාර්යසාධන මට්ටමක් අඛණ්ඩව පවත්වාගෙන යාම උදෙසා පුහුණු හා සංවර්ධන ඒකකය මගින් ක්‍රියාත්මක කරනු ලබන පුහුණු හා සංවර්ධන වැඩසටහන් විශාල දායකත්වයක් ලබා දේ.

දෙපාර්තමේන්තුව වෙත වාර්ෂික ස්ථාන මාරුවීම් පදනමින් හා නව බඳවා ගැනීම් යටතේ කාර්යය මණ්ඩලය සඳහා එක්වන නිලධාරීන් සඳහා දෙපාර්තමේන්තු කර්යභාර්ය පිළිබඳ ලබා දෙන විධිමත් පුහුණුවට අමතරව, එම නිලධාරීන් දෙපාර්තමේන්තුවේ සේවය කරන කාල සීමාව තුළ ඔවුන්ට අවශ්‍ය වන දැනුම හා ප්‍රායෝගික පුහුණුව යාවත්කාලීන කිරීම සඳහා අඛණ්ඩ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක වේ.

ඒ අනුව, පුහුණු හා සංවර්ධන වැඩසටහන් සඳහා දේශිය වශයෙන් අයවැය මගින් වෙන්කරනු ලැබූ ප්‍රතිපාදන මිලියන 7 කි. 2025 වර්ෂයේ පුහුණු හා සංවර්ධන අංශය ක්‍රියාත්මක කළ සමස්ථ වැඩසටහන් සංඛ්‍යාව 37 ක් වන අතර එයින් වැඩසටහන් 26 ක් දේශිය ප්‍රතිපාදන මගින් ද, 11ක් තනාපති කාර්යාල ජාත්‍යන්තර සංවිධාන හා බාහිර ආයතනයන්ගේ අනුග්‍රාහකත්වය යටතේ පවත්වන ලදී.

**26**
දේශීය පුහුණු සංඛ්‍යාව

**11**
විදේශීය පුහුණු සංඛ්‍යාව

**37**
සමස්ථ පුහුණු සංඛ්‍යාව



# අනුකූලතා වාර්තාව

# 07 පරිච්ඡේදය

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ, ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 1 | පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ / ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශන | අනුකූල වේ | - | - |
| 1.2 | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූල වේ | - | - |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්) | - | - | - |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම් | - | - | - |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම් | - | - | - |
| 1.6 | වෙනත් | - | - | - |
| 2 | පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ. 445) | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන / පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.5 | සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | - | - |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | - | - |

| | | | | |
|---|---|---|---|---|
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.11 | උප පත්‍රිකාපොත් ලේඛනය (GA - N20) යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | - | - |
| **3** | මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135) | | | |
| 3.1 | මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දීම | අනුකූල වේ | - | - |
| 3.2 | මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කිරීම | අනුකූල වේ | - | - |
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම | අනුකූල වේ | - | - |
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | අනුකූල වේ | - | - |
| **4** | වාර්ෂික සැලසුම් සකස් කිරීම | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (හර්‍ෂ) නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **5** | විගණන විමසුම් | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියලුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම | අනුකූල නොවේ | අංශ මගින් තොරතුරු ලබා ගැනීමට කාලය ගතවීම | අංශ සියල්ලම පොදුවේ රැස්වී පිළිතුරු සාකච්ඡා කිරීම |
| **6** | අභ්‍යන්තර විගණනය | | | |
| 6.1 | මු.රෙ. 134(2) ඈ/1-2019 අනුව, වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම. | අනුකූල වේ | | |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම. | අනුකූල වේ | | |
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තෙමේන්තුවට ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 6.4 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| **7** | විගණන හා කළමනාකරණ කමිටු | | | |
| 7.1 | DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම. | අනුකූල වේ | | |
| **8** | වත්කම් කළමනාකරණය | | | |
| 8.1 | අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | - | - |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත වාර්තාකර තිබීම. | අනුකූල වේ | - | - |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල නොවේ | 2025 පෙබ. සිට මැයි දක්වා ගමන් බලපත්‍ර නිකුත් කිරීමේ සේවාව පැය 24 ක්‍රියාත්මක කිරීම හේතුවෙන් දෙපාර්තමේන්තුවේ අංශවල භාණ්ඩ සමීක්ෂණ කටයුතු අවසන් කිරීම අපහසු වීම හා භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල සාමාජිකයින් හා වාහන යොදවා ගැනීමේ අපහසුතා ඇතිවීම | 2026 වර්ෂය තුල නියමිත දිනවලදී කටයුතු අවසන් කිරීමට උපදෙස් දීම |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම. | අනුකූල නොවේ | | |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම | අනුකූල වේ | - | - |

| | | | | |
|---|---|---|---|---|
| **9** | වාහන කළමනාකරණය | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම. | අනුකූල වේ | | |
| 9.2 | වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම. | අනුකූල වේ | | |
| 9.3 | වාහන ලොග් පොත පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | | |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම. | අනුකූල වේ | | |
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම. | අනුකූල නොවේ | | |
| 9.6 | කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම. | අනුකූල නොවේ | | |
| **10** | බැංකු ගිණුම් කළමනාකරණය | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | - | - |
| 10.2 | සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ සක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම. | අනුකූල වේ | - | - |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බබන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම. | අනුකූල වේ | - | - |
| **11** | ප්‍රතිපාදන උපයෝජනය | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම. | අනුකූල වේ | - | - |
| 11.2 | මු.රෙ. 94 (1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම. | අනුකූල වේ | - | - |
| **12** | රජයේ නිලධාරීනගේ අත්තිකාරම් ගිණුම් | | | |
| 12.1 | සීමාවන්ට අනුකූල වීම | අනුකූල වේ | - | - |
| 12.2 | හිඟහිට ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම. | අනුකූල වේ | - | - |

| | | | | |
|---|---|---|---|---|
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම. | අනුකූල නොවේ | සේවය හැරගිය, වැඩ තහනම්කල සහ විශ්‍රාම ගිය නිලධාරීන්ගේ ණය ශේෂ අයකරගෙන අවසන් නොවීම | අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. |
| **13** | පොදු තැන්පත් ගිණුම | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම. | අනුකූල වේ | - | - |
| 13.2 | සාමාන්‍ය තැන්පතු සඳහා පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන ගොස් ඇත | අනුකූල වේ | - | - |
| **14** | අග්‍රිම ගිණුම | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම. | අනුකූල වේ | - | - |
| 14.2 | මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම. | අනුකූල නොවේ | අතුරු අග්‍රිමය ලබා ගත් කාර්යය සමහර අවස්ථාවලදී මසකට වඩා වැඩි කාලයක් දක්වා දිව යෑම. | තත්කාර්ය අතුරු අග්‍රිමයේ කාර්යය අවසන් වූ විගස පියවීමට අදාල නිලධාරියා දැනුවත් කිරීම. |
| 14.3 | මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම. | අනුකූල වේ | - | - |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමග මාසිකව සැසඳුම් කිරීම. | අනුකූල වේ | - | - |
| **15** | ආදායම් ගිණුම | | | |
| 15.1 | අදාළ රෙගුලාසිවලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදුකොට තිබීම. | අනුකූල වේ | - | - |
| 15.2 | රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට ඍජුවම ආදායමට බැර කර තිබීම. | අනුකූල වේ | - | - |
| 15.3 | මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | - | - |
| **16** | මානව සම්පත් කළමනාකරණය | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම. | අනුකූල වේ | | |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයින් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම. | අනුකූල වේ | | |
| 16.3 | 20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| **17** | මහජනයා වෙත තොරතුරු ලබා දීම | | | |
| 17.1 | තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියකු පත්කොට තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | | |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබාදී තිබෙන අතර වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා / චෝදනා පළ කිරීමට පහසුකම් සලසා තිබීම. | අනුකූල වේ | | |
| 17.3 | තොරතුරු දැන ගැනීමේ පනතේ 8 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| **18** | පුරවැසි ප්‍රඥාප්තිය ක්‍රියාත්මක කිරීම. | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018 (1) දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි / සේවාලාභී ප්‍රඥාප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම. | අනුකූල වේ | | |
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි / සේවාලාභී ප්‍රඥාප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම් සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම. | අනුකූල වේ | | |
| **19** | මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම. | අනුකූල වේ | | |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම. | අනුකූල වේ | | |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 1 හි දැක්වෙන ආකෘති පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම. | - | | |
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදයේ ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියකු පත්කර තිබීම. | අනුකූල වේ | | |
| **20** | විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් තළ විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම. | අනුකූල වේ | - | - |

# ඇමුණුම්

# ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. } JLO/E/DIE/FS/2025/01 | ඔබේ අංකය / உமது இல. / Your No. } | දිනය / திகதி / Date } 2026 ජූනි 08 දින |

පාලක ජනරාල්
ආගමන හා විගමන දෙපාර්තමේන්තුව

**ශීර්ෂය 226 - ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 226 - ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ (සංශෝධිත පරිදි) 11(1) වගන්තිය ප්‍රකාරව ආගමන හා විගමන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථාකාලයේ දී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස්කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තරකර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව    இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை.    No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34    +94 11 2 88 72 23    ag@auditorgeneral.gov.lk    www.naosl.gov.lk

1.3 **කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස්කිරීමේ පදනම**

මෙම මූල්‍ය ප්‍රකාශන සකස්කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1 කෙරෙහි අවධානය යොමුකරවමි. මූල්‍ය ප්‍රකාශන, රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 අනුව ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස්කර ඇත. එමනිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව ආගමන හා විගමන දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණුකර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025ට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසිපරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතු ය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උපවගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස්කර පවත්වාගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරි සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදුකර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදුකරනු ලැබිය යුතු ය.

1.5 **මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත්කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේ දී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණයකර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම්කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ දී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයාගැනීමේ දී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

2

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශකිරීමේ අදහසින් නොවුව ද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළ දී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරි දැනුවත් කරමි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 ආදායම්**

(අ) සමාලෝචිත වර්ෂය සඳහා දෙපාර්තමේන්තුවේ තොටුපල, පුරවැසි, වීසා අංශ හා ගමන් බලපත්‍ර අංශවලට අදාළව මුදල් පොත හා පරිගණක පද්ධතිය අනුව ආදායම සැසඳීමේ දී, ආදායමෙහි වෙනස රු.6,994,420,938ක් වූ අතර, විද්‍යුත් සංචරණ අනුමැතිය (ETA) හා විදේශදූත මණ්ඩල අංශයේ ජනවාරි, පෙබරවාරි, අප්‍රේල්, මැයි, ජූනි හා අගෝස්තු යන මාසයන් සඳහා පරිගණක පද්ධතිය අනුව ආදායම සටහන් වී නොතිබූ බැවින් විගණනයේ දී සමස්ත ආදායමෙහි වෙනස ගණනය කිරීමක් සිදුකළ නොහැකි විය. එසේ යාවත්කාලීන හා නිවැරදි තොරතුරු ලබාගත නොහැකි පරිගණක පද්ධති වෙනුවෙන් දෙපාර්තමේන්තුව විසින් වසර 23ක කාලයක් පුරා පැරණි ගිවිසුම් අලුත් කරමින් ගෙවීම් කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ආදායම් රැස්කිරීම් පරීක්ෂාකිරීමේ දී, භාණ්ඩාගාර මාසික ආදායම් වාර්තාව (SA 21) හා දෙපාර්තමේන්තු ආදායම් ප්‍රකාශය (ACA-1) සංසන්දය කිරීමේ දී මුළු එකතුව සමාන වුව ද, දෙපාර්තමේන්තුව විසින් රැස්කළ ආදායම හා වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු විසින් රැස්කළ ආදායම වෙන වෙනම සංසන්දනය කිරීමේ දී රු.24,670,955,029ක වෙනසක් නිරීක්ෂණය විය.

**2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 වියදම් කළමනාකරණය**

(අ) මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව හැකිතාක් සම්පූර්ණ හා නිවැරදිව ඇස්තමේන්තු පිළියෙල නොකිරීම නිසා සමාලෝචිත වර්ෂයේ දී පුනරාවර්තන වැය විෂයන් 04ක් හා ප්‍රාග්ධන වැය විෂයන් 05ක් සඳහා ප්‍රතිපාදිත රු.5,439,000,000ක මුදලින් රු.961,036,000ක් මුදල්

3

රෙගුලාසි 66 යටතේ වෙනත් වැය විෂයන්ට මාරුකර රු.967,134,000ක් වෙනත් වැය විෂයන් වෙතින් ලබාගෙන තිබූ අතර, එය සියයට (-82)ත් සියයට 187ත් අතර පරාසයක් ගෙන තිබුණි.

(ආ) ප්‍රාග්ධන වැය විෂයයක හා පුනරාවර්තන වැය විෂයයක ප්‍රතිපාදිත මුදල වන රු.10,000,000ක මුදල වැයනොකර සියයට 100ක් ඉතිරිව පැවතුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ඇස්තමේන්තු පිළියෙල කිරීමේ දී වියදම් සම්පූර්ණව හා නිවැරදිව හඳුනා නොගැනීම නිසා පුනරාවර්තන වැය විෂයන් 16ක ප්‍රතිපාදිත රු.2,068,464,000ක මුදලින් රු.1,135,563,598ක් ඉතිරි වී තිබූ අතර, එම ඉතිරිය සියයට 20 සිට සියයට 99 දක්වා පරාසයක් ගෙන තිබුණු අතර, ප්‍රාග්ධන වැය විෂයයන් 7ක ප්‍රතිපාදිත රු.32,207,120,000ක මුදලින් රු.2,425,003,560ක් ඉතිරි වී තිබූ අතර, එම ඉතිරිය සියයට 12 සිට සියයට 96 දක්වා පරාසයක් ගෙන තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දී ගමන් ලිපිලේඛන හා අදාළ උපාංග වෙනුවෙන් වෙන්කර තිබූ ප්‍රතිපාදන රු.4,000,000,000කින් රු.1,000,000,000ක් පරිපූරක ඇස්තමේන්තු ලෙස අවුරා තබා තිබූ අතර, එය ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස සියයට 25ක් විය. එකී වැය විෂයෙහි මුළු වියදම රු.2,619,328,012ක් වන අතර, රු.380,671,988ක ප්‍රතිපාදන ඉතිරියක් ද පැවතුණු අතර, මුළු ඇස්තමේන්තු මුදලින් සියයට 65ක් පමණක් වැයකර තිබුණි. ඒ අනුව මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව සම්පූර්ණව හා නිවැරදිව වියදම් ඇස්තමේන්තුව පිළියෙලකර නොතිබුණි.

### 3.2 බැරකම් හා බැඳීම් වලට එළැඹීම

(අ) සමාලෝචිත වර්ෂය තුළ දෙපාර්තමේන්තුවේ වැය විෂයන් 02ක සලසා තිබූ ප්‍රතිපාදන ඉතිරිය ඉක්මවා රු.4,855,434ක බැරකම්වලට එළැඹී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ බැරකම් පිළිබඳ ප්‍රකාශනයෙහි (ඇමුණුම iv) සටහන්කර ඇති නමුත්, භාණ්ඩාගාර සටහනෙහි (SA 92) සටහන් නොවූ බැරකම්වල මුළු වටිනාකම රු.2,852,247ක් විය.

(ඇ) දෙපාර්තමේන්තුවේ සමාලෝචිත වර්ෂයේ බැඳීම් හා බැරකම් ප්‍රකාශනයෙහි, බැරකම් ලේඛනයෙහි හා භාණ්ඩාගාර සටහනෙහි (SA 92) ඇතුළත් නොවූ මුළු වටිනාකම රු.2,472,867ක බැරකම්, 2026 වර්ෂයේ දී නිරවුල් කර තිබුණි.

### 3.3 ගණන්දීමේ නිලධාරි විසින් සිදුකළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරි විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතිකවීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතුකර නොතිබුණි.

(අ) දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස්කර පවත්වාගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදුකර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදුකරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදුකර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත්කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදුකළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

4

(ආ) විගණකාධිපතිට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියලුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදුවන බවට ගණන්දීමේ නිලධාරි විසින් සහතික විය යුතු වුවත්, වාර්තාවේ 4.3 ඡේදය ප්‍රකාරව විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී නොතිබුණි.

## 3.4 නීතිරීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| | නීතිරීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XII වැනි පරිච්ඡේදයේ 23:18 ඡේදය | රජයේ නිලධරයන් දිවයිනෙන් බැහැර ගතකරන නිවාඩු පිළිබඳ වාර්තාවක් දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් මාසිකව විගණකාධිපති වෙත ඉදිරිපත්කළ යුතු වුව ද, ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 571 (3) | ඉකුත් වූ තැන්පතු රාජ්‍ය ආදායමට බැරකිරීම හෝ හැකි ඉක්මණින් ආපසු ගෙවිය යුතු වුව ද, පොදු තැන්පතු ලෙජරයේ කොන්ත්‍රාත් සඳහා වූ රැඳවුම් මුදල්වලට අදාළව වර්ෂ 2 ඉක්මවූ තැන්පතු එකතුව රු.11,980,022ක් සහ ව්‍යවස්ථාපිත ගෙවීම් වෙනුවෙන් තාවකාලිකව රඳවාගන්නා තැන්පතු සඳහා වූ රැඳවුම් මුදල්වලට අදාළව වර්ෂ 2 ඉක්මවූ තැන්පතු එකතුව රු.778,175ක් ද අදාළ ගිණුමට හෝ රජයේ ආදායමට බැරකිරීමට හෝ කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය | |
| | (i) 3.5.1(ආ) ඡේදය | සෘජු කොන්ත්‍රාත් ක්‍රමය භාවිතාකළ යුත්තේ විශේෂ අවස්ථානුගත කරුණු යටතේ පමණක් වුව ද, විද්‍යුත් සංචරණ අනුමැතිය පද්ධතිය (ETA) හා දේශසීමා ආවේක්ෂණ ඒකකය (BSU) සඳහා අවධානම් කළමනාකරණ මොඩියුලය ප්‍රසම්පාදනය, දෙපාර්තමේන්තුවේ සංඛ්‍යාන වාර්තා උත්පාදන හා උපකරණ පුවරු මොඩියුලය ප්‍රසම්පාදන හා වීසා කාලසීමාව ඉක්මවා රැදී සිටින මගීන් ප්‍රමාණය අවමකිරීමේ මොඩියුලය යන ප්‍රසම්පාදනයන් සඳහා තරඟකාරී ප්‍රසම්පාදන ක්‍රමයක් තෝරාගැනීම වෙනුවට සෘජු කොන්ත්‍රාත් ක්‍රමය අනුගමනයකර තිබුණි. |
| | (ii) 2.8.4(ඇ) ඡේදය | දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු සඳහා තාක්ෂණික ඇගයීම් කමිටු පත්කිරීමේ දී අවම වශයෙන් එක් සාමාජිකයෙක් රේඛීය අමාත්‍යාංශයෙන් හෝ ප්‍රසම්පාදන අස්ථිත්වයෙන් බාහිර ප්‍රසම්පාදන විෂය සම්බන්ධයෙන් දැනුමක් ඇති අයෙකු විය යුතු නමුත්, වීසා කාලසීමාව ඉක්මවා රැදී සිටින මගීන් ප්‍රමාණය අවමකිරීමේ මොඩියුලය හා මාර්ගගත ක්‍රමයේ සාමාන්‍ය සේවය යටතේ ලද අයදුම්පත් එක්දින සේවාවට පරිවර්තනය කිරීමේ මාර්ගගත ගමන් බලපත්‍ර මොඩියුලය වැඩිදියුණු කිරීම යන ප්‍රසම්පාදනයන්ට අදාළව තාක්ෂණික ඇගයීම් කමිටු පත්කිරීමේ දී ඉන් පරිබාහිරව කටයුතුකර තිබුණි. |

5

4. **මෙහෙයුම් සමාලෝචනය**

4.1 **කාර්ය සාධනය**

4.1.1 **කාර්යභාරයන් ඉටුනොකිරීම**

(අ) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අදාළ ප්‍රගති වාර්තාව අනුව ගොඩනැගිලි හා ඉදිකිරීම් යටතේ වවුනියා විවේකාගාරය අලුත්වැඩියා කිරීම සඳහා මුළු වටිනාකම රු.මිලියන 4ක් ඇස්තමේන්තුකර තිබුණු අතර, වර්ෂය අවසානයට එහි මූල්‍ය ප්‍රගතියක් නොමැති අතර, භෞතික ප්‍රගතිය සියයට 5ක් විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ දී යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ අත්පත්කර ගැනීම යටතේ BIA arrival Networking, 9 Nos UPS (for kandy, Galle, KKS, Palali, Matara, Vavniya, Colombo Harbour), ABIS Server, Purchasing of Passport Printers මිලදීගැනීම සඳහා මුළු වටිනාකම රු.මිලියන 1,129ක් ඇස්තමේන්තුකර තිබුණු අතර, වර්ෂය අවසානයට එහි මූල්‍ය ප්‍රගතියක් නොමැති අතර, භෞතික ප්‍රගතිය සියයට 10ක් විය. තව ද, 12 Nos of finger print scanners, 04 Displays Units (10-50" TV's & 17 NUC Computers), Biomatic Attendence Machines 12 මිලදීගැනීම සඳහා මුළු වටිනාකම රු.මිලියන 10.5 ඇස්තමේන්තුකර තිබුණු අතර, වර්ෂය අවසානයට එහි මූල්‍ය ප්‍රගතියක් නොමැති අතර, භෞතික ප්‍රගතිය සියයට 50ක් විය.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දී මෘදුකාංග සංවර්ධනය යටතේ Supply - installation - testing and maintenance of ICAO standard photo capturing software for photo studios, Business Process Re- engineering, හා Continuation of Change Requests 2024 සඳහා මුළු වටිනාකම රු.මිලියන 330ක් ඇස්තමේන්තුකර තිබුණු අතර, වර්ෂය අවසානයට එම කාර්යයන්හි මූල්‍ය ප්‍රගතියක් නොමැති වූ අතර, භෞතික ප්‍රගතිය සියයට 10ක් විය. ඒ අනුව අදාළ කාර්යයන් සැලසුම්කළ පරිදි ඉටුකර නොතිබුණි.

4.1.2 **වාර්ෂික කාර්ය සාධන වාර්තාව**

(අ) දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාවේ ප්‍රධාන කාර්ය සාධක දර්ශක (KPI) හතර අතරින් ප්‍රධාන දර්ශකයක් ලෙස "එක්දින සේවාව යටතේ ලැබුණු ගමන් බලපත්‍ර අයදුම්පත් සංඛ්‍යාවට අනුව දිනක් තුළ නිකුත්කළ ගමන් බලපත්‍ර සංඛ්‍යාවේ ප්‍රතිශතය" ගණනය කරනු ලැබුවත් "සාමාන්‍ය සේවාව යටතේ ලැබුණු ගමන් බලපත්‍ර අයදුම්පත් සංඛ්‍යාවට අනුව දිනක් තුළ නිකුත්කළ ගමන් බලපත්‍ර සංඛ්‍යාවේ ප්‍රතිශතය ගණනය කිරීමක් සිදුකර නොතිබූ අතර, එය කාර්ය සාධන වාර්තාවේ ප්‍රධාන කාර්ය සාධක දර්ශක තුළට ඇතුළත්කර නොතිබුණි.

(ආ) 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ 1/2020හි මාර්ගෝපදේශ අංක 05 ප්‍රකාරව වාර්ෂික කාර්ය සාධන වාර්තාවේ මානව සම්පත් පැතිකඩහි (පරිච්ඡේදය 06) සේවක සංඛ්‍යා කළමනාකරණය (6.1) යටතේ පැවතිය යුතු අනුමත සේවක සංඛ්‍යාව, පවතින සේවක සංඛ්‍යාව හා අතිරික්ත / ඌණ සේවක සංඛ්‍යා පිළිබඳ තොරතුරු කිසිවක් සමාලෝචිත වර්ෂයේ කාර්ය සාධන වාර්තාව තුළ අන්තර්ගත කර නොතිබුණි.

4.2 **ප්‍රසම්පාදනයන්**

(අ) දෙපාර්තමේන්තුවේ විද්‍යුත් සංචරණ අනුමැතිය පද්ධතිය (ETA) හා දේශසීමා ආවේක්ෂණ (BSU) ඒකකයන් සඳහා අවදානම් කළමනාකරණ මොඩියුලය ස්ථාපිත කිරීමේ ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

6

(i) වගකීම් කාලය ද ඉක්මවූ මොඩියුලය ප්‍රසම්පාදනට අදාළව රඳවාගත් මුදල වන රු.1,628,000ක අදාළ පුද්ගලික සමාගමට ගෙවීම හෝ රජයේ ආදායමට බැරකිරීම හෝ සිදුකර නොතිබුණි.

(ii) පිරිවැය රු.16,280,000ක් වූ මොඩියුලය දෙපාර්තමේන්තුව විසින් වසර 4කට ආසන්න කාලයක් කිසිදු ආකාරයක භාවිතයට ගැනීමක් සිදුකර නොතිබුණි.

(ආ) දෙපාර්තමේන්තුවේ සංඛ්‍යාන වාර්තා උත්පාදන හා උපකරණ පුවරු මොඩියුලය (Statistical Report Generation and Dashboard Module) ස්ථාපිත කිරීමේ ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

(i) 2021 දෙසැම්බර් 29 දිනැති අංක DIE/IT/02/SW-Border.M-2021 දරන ලිපියෙන් පාලක (තොරතුරු තාක්ෂණ) විසින් සංඛ්‍යාන වාර්තා උත්පාදන හා උපකරණ පුවරු මොඩියුලය ස්ථාපනය කිරීම සම්පූර්ණයෙන් අවසන්කර ඇති බවත්, පරිශීලකයන්ගේ එකඟතා පරීක්ෂාව (UAT) 2021 දෙසැම්බර් 27 දින සිදුකර ඇති බවත් සඳහන් කරමින් ගෙවිය යුතු රු.13,275,000ක මුදල 2021 දෙසැම්බර් 29 දින අදාළ පුද්ගලික සමාගම වෙත ගෙවීම සිදුකොට තිබුණු නමුත්, මේ දක්වා වසර 4කට ආසන්න කාලයක් තුළ දෙපාර්තමේන්තුව විසින් මෙම මොඩියුලය කිසිදු ආකාරයකට භාවිතයට ගැනීමක් සිදුකර නොතිබුණි.

(ii) වගකීම් කාලය ද ඉක්මවූ මොඩියුලය ප්‍රසම්පාදනට අදාළව රඳවාගත් මුදල වන රු.1,475,000ක් අදාළ පුද්ගලික සමාගමට ගෙවීම හෝ රජයේ ආදායමට බැරකිරීම හෝ කටයුතු ද කර නොතිබුණි.

(ඇ) ද්විත්ව පුරවැසි (CIT) මොඩියුලය හා විදේශදූත මණ්ඩල (OM) මොඩියුලය ප්‍රතිසංස්කරණය කිරීමේ ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

(i) CIT මොඩියුලය ප්‍රතිසංස්කරණය කිරීමට අදාළව පළමු පියවර සිදුකිරීමට නියෝජ්‍ය පාලක(පුරවැසි) විසින් 2022 පෙබරවාරි මස 11 වන දින මෘදුකාංග අවශ්‍යතාවය පිළිබඳ ඉල්ලීම (Software request form) ඉදිරිපත්කර තිබුණු නමුත් OM මොඩියුලය ප්‍රතිසංස්කරණය කිරීමට අදාළ අවශ්‍යතාවය පිළිබඳ ඉල්ලීම ප්‍රසම්පාදන ගොනුවේ ඇතුළත්ව නොතිබුණි.

(ii) වගකීම් කාලය ද ඉක්මවූ උක්ත මොඩියුලය ප්‍රසම්පාදනට අදාළව රඳවාගත් මුදල වන රු.2,950,037ක් අදාළ පුද්ගලික සමාගමට ගෙවීම හෝ රජයේ ආදායමට බැරකිරීම හෝ කටයුතු ද කර නොතිබුණි.

(iii) මොඩියුලය ප්‍රතිසංස්කරණ කිරීම සඳහා රු.29,500,375ක පිරිවැයක් දරා තිබූ නමුත් මේ දක්වා එනම් වසර 4කට ආසන්න කාලයක් තුළ දෙපාර්තමේන්තුව විසින් මෙම මොඩියුලය කිසිදු ආකාරයකට භාවිතයට ගැනීමක් සිදුකර නොතිබුණි.

(ඇ) වීසා කාලසීමාව ඉක්මවා රැදී සිටින මගීන් ප්‍රමාණය අවමකිරීමේ මොඩියුලය (Mitigation of Overstay Passengers Module) ස්ථාපිත කිරීමේ ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

(i) වීසා කාලසීමාව ඉක්මවා රැඳී සිටින මගීන් ප්‍රමාණය අවමකිරීමේ මොඩියුලයට අදාළව ඉදිරිපත්කළ යුතු මෘදුකාංග ඉල්ලුම්පත්‍රය (Software request form) හා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ යොමුව 2.12 ප්‍රකාරව තාක්ෂණික ඇගයීම් කමිටු සාමාජිකයන් විසින් කරනු ලබන ප්‍රකාශයන් (Declaration form) අදාළ ප්‍රසම්පාදන ගොනුව තුළ ඇතුළත්ව නොතිබුණි.

(ii) 2021 දෙසැම්බර් 29 දිනැති අංක DIE/IT/02/SW-Border.M-2021 දරන ලිපියෙන් පාලක (තොරතුරු තාක්ෂණ) විසින් මෙම මොඩියුලය ස්ථාපනය කිරීම සම්පූර්ණයෙන් අවසන්කර ඇති බවත්, පරිශීලකයන්ගේ එකඟතා පරීක්ෂාව (UAT) 2021 දෙසැම්බර් 14 දින සිදුකර ඇති බව සඳහන් කරමින් ඒ සඳහා ගෙවිය යුතු රු.3,707,975ක මුදල අදාළ පුද්ගලික සමාගම වෙත ගෙවීම සිදුකොට තිබුණු නමුත් මේ දින වන විට වසර 4කට ආසන්න කාලයක් තුළ දෙපාර්තමේන්තුව විසින් මෙම මොඩියුලය කිසිදු ආකාරයකට භාවිතයට ගැනීමක් සිදුකර නොතිබුණි.

(iii) මොඩියුලයේ කොන්ත්‍රාත් මිල යෝජනාව අනුව ගොනුගතකරණය හා පුහුණු කිරීම් වෙනුවෙන් රු.150,000ක මුදලක් වෙන්කර තිබුණු නමුත් එම පුහුණුවත් සමග තොරතුරු පද්ධතිය නිසියාකාරයෙන් භාවිතයට ගැනීමක් සිදුකර නොතිබුණි.

(iv) වගකීම් කාලය ද ඉක්මවූ මොඩියුලය ප්‍රසම්පාදනට අදාළව රඳවාගත් මුදල වන රු.412,000කට අදාළ පුද්ගලික සමාගමට ගෙවීම හෝ රජයේ ආදායමට බැරකිරීම හෝ සිදුකර නොතිබුණි.

(ඉ) මාර්ගගත ක්‍රමයේ සාමාන්‍ය සේවය යටතේ ලද අයදුම්පත් එක්දින සේවාවට පරිවර්තනය කිරීම සඳහා මාර්ගගත ගමන් බලපත්‍ර මොඩියුලය වැඩිදියුණු කිරීමේ ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

(i) සාමාන්‍ය සේවය යටතේ යොමුකරන ලද මාර්ගගත එක්දින සේවාවට පරිවර්තනය කිරීම සඳහා ලද අයදුම්පත් හා නිකුත්කරන ලද ගමන් බලපත්‍ර පිළිබඳ කරන ලද නියැදි පරීක්ෂාවට අනුව මාසිකව සාමාන්‍ය අයදුම්පත් 74ත් 249ත් අතර ප්‍රමාණයක් එක්දින සේවාවට පරිවර්තනයකර තිබූ අතර, එය මාසිකව නිකුත්කරනු ලබන විදේශ ගමන් බලපත්‍ර ප්‍රමාණයෙන් (2024 වර්ෂයේ කාර්ය සාධන වාර්තාවට අනුව) සියයට 1කටත් වඩා අඩු ප්‍රමාණයක් වන අතර, වර්තමානය වන විට මෙම පරිවර්තනය කිරීමේ සේවාව සඳහා වන ඉල්ලුම ද ක්‍රමිකව අඩුව පැවතුණි. ඒ අනුව සාමාන්‍ය සේවයේ අයදුම්කරුවන් සඳහා දිනක් ඇතුළත ගමන් බලපත්‍රය ලබාගැනීමට පද්ධතිය හරහා සේවා වර්ගය (service type change) වෙනස් කිරීම සඳහා පිරිවැය-ඵලදායි විකල්ප ක්‍රමවේදයක් අනුගමනය කිරීම වෙනුවට රු.මිලියන 4.4ක විශාල පිරිවැයක් දරා තිබුණි.

(ii) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.12 ඡේදය ප්‍රකාරව ප්‍රසම්පාදන කමිටුවල තාක්ෂණික ඇගයීම් කමිටු සාමාජිකයන් විසින් කරනු ලබන ප්‍රකාශයන් (Declaration form) ප්‍රසම්පාදන ගොනුව තුළ ඇතුළත්ව නොතිබුණි.

### 4.3 විගණන විමසුම්වලට පිළිතුරු ලබානොදීම

සමාලෝචිත වර්ෂයට අදාළව නිකුත්කරන ලද විගණන විමසුම් 06ක් සම්බන්ධයෙන් මේ දක්වා පිළිතුරු ලබාදී නොතිබුණි.

4.4 කළමනාකරණ දුර්වලතා

(අ) සේවක අර්ථසාධක අරමුදල් පනත ප්‍රකාරව අනුමත අර්ථසාධක අරමුදල් ගෙවීමට ක්‍රියාකළ යුතු වුවත්, අනියම් කාර්යාල කම්කරු සේවකයන් සඳහා අදාළ ගෙවීම් කිරීමේ දී රාජ්‍ය සේවක අර්ථසාධක අරමුදලට සේවකයන් විසින් ගෙවිය යුතු මුදල අයකර ගැනීමක් හා සේවායෝජකයා විසින් අර්ථසාධක අරමුදලට සේවකයා වෙනුවෙන් ගෙවිය යුතු මුදල ගෙවා නොතිබුණි.

(ආ) සයිබර් ආරක්ෂණ ප්‍රතිපත්තියෙහි අංක 4.1.7 ප්‍රකාරව ආයතනයන්හි ඉතා රහසිගත හෝ රහසිගත තොරතුරු වත්කම් හෝ තීරණාත්මක ජාතික තොරතුරු යටිතල පහසුකම් සහිත පද්ධති සම්බන්ධයෙන් කටයුතු කරන නිලධාරියාගේ පසුබිම් පරීක්ෂණ හා ආරක්ෂණ නිෂ්කාශන සිදුකර තිබිය යුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ඇ) ආයතනයේ වත්කම්වලට ඇති අවදානම් සහ එමගින් වන බලපෑම තීරණය කිරීම සඳහා විධිමත් තක්සේරුවක් තොරතුරු හා සයිබර් ආරක්ෂණ ප්‍රතිපත්තියෙහි අංක 4.2.5 ප්‍රකාරව සිදුකළ යුතු වුවත්, දෙපාර්තමේන්තුව විසින් එසේ විධිමත් තක්සේරුවක් සිදුකර නොතිබුණි.

(ඈ) ආයතනය විසින් ප්‍රතිපත්ති අංක 4.2.4 හා 4.2.5 ප්‍රකාරව තොරතුරු වත්කම් ලේඛනයක් (Information Assets register), තොරතුරු තාක්ෂණ වත්කම් ලේඛනයක් (IT Assets register) හා අවදානම් ලේඛනයක් (Risk register) පවත්වාගත යුතු වුවත්, එම ලේඛනයන් පවත්වා නොතිබුණි.

(ඉ) සයිබර් ආරක්ෂණ ප්‍රතිපත්තියෙහි 4.2.6 ප්‍රකාරව තොරතුරු තාක්ෂණ වත්කම් ඒවායේ තීරණාත්මකභාවය (criticality) මත වර්ගීකරණය කළ යුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ඊ) සයිබර් ආරක්ෂණ ප්‍රතිපත්තියෙහි 4.3.6 ප්‍රකාරව ආයතනය දත්ත එක්රැස් කිරීම, සැකසීම සහ ගබඩා කිරීම සිදුකරන විට දත්තවල ස්වෛරීභාවය (Data Sovereignty) පිළිබඳව සැලකිල්ලට ගැනීම සහ 4.3.10 ප්‍රකාරව විද්‍යුත් තැපැල් මගින් සංවේදී තොරතුරු හුවමාරු කරන විට කේතනය (encrypt) භාවිතාකිරීම සිදුකළ යුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(උ) ආයතනයේ පරිගණක මෙහෙයුම් පද්ධති සැපයුම්කරු විසින් සපයන ලද නවතම සරිමා මගින් (Patch updates) යාවත්කාලීන කළ යුතු වුවත්, සයිබර් ආරක්ෂණ ප්‍රතිපත්තියෙහි 4.3.7 ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් එසේ යාවත්කාලීනකර නොතිබූ අතර, 4.3.7 ප්‍රකාරව ආයතනය විසින් සැපයුම්කරුවන් සපයන ලද තීරණාත්මක සරිමා ස්ථාපනය කිරීමට (Patch updates) පෙර නිසිඇගයීමකට ද භාජනය කළ යුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ඌ) තොරතුරු හා සයිබර් ආරක්ෂණ ප්‍රතිපත්තියෙහි 4.3.18 ප්‍රකාරව ආයතනය සතුව අභ්‍යන්තර තොරතුරු හා සයිබර් ආරක්ෂණ විගණන වැඩසටහනක් පැවැත්විය යුතු අතර, ආයතනය ඕනෑම වෙබ් අඩවියක්, වෙබ් යෙදුමක් පද්ධතියක් හෝ පරිගණක ජාල නිලවශයෙන් දියත් කිරීමට පෙර ශ්‍රී ලංකා සර්ට් ආයතනය මගින් අවදානම් තක්සේරු කිරීම් හා විනිවිදයාමේ පරීක්ෂණයක් ද (Penetration Tests) සිදුකළ යුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

9

(එ) තොරතුරු හා සයිබර් ආරක්ෂණ ප්‍රතිපත්තියෙහි 4.6.1 ප්‍රකාරව යම් ආපදාවක දී (හෝ සිදුවීමක දී), බිඳ වැටුණු හෝ අඩපණ වූ සේවාවන් යථාතත්ත්වයට පත්කිරීම සඳහා සකස්කරන ලද ආපදා ප්‍රතිසාධන සැලැස්මක් (Disaster Recovery Plan) ආයතනයට තිබිය යුතු වුවත්, එවැනි ආපදා ප්‍රතිසාධන සැලැස්මක් නොතිබුණි.

(ඒ) 2024 හා 2025 වර්ෂයන්ට අදාළව විදේශදූත මණ්ඩල අංශය වෙත ලද එහෙත් අඩුපාඩු හේතුවෙන් නිකුත්කිරීමට නොහැකිවූ (Pending) අයදුම්පත් පිළිබඳ නියැදි පරීක්ෂාවේ දී, එම අඩුපාඩු පිළිබඳව අදාළ අයදුම්කරුවන්ගේ විදේශදූත මණ්ඩලයන් වෙත විද්‍යුත් තැපැල් පණිවිඩ ඔස්සේ දැනුම්දීමට දින 42 සිට 360 දක්වා දීර්ඝ කාලයක් ගත කර තිබුණු අතර, එකී අඩුපාඩු සහිත අයදුම්පත්‍ර පිළිබඳව විදේශදූත මණ්ඩලයන් වෙත දැනුම්දීම සඳහා සකසන ලද ලිපිය අත්සන් කරන ලද දිනයත්, සත්‍ය වශයෙන් එම ලිපිය ඇතුළත් විද්‍යුත් තැපැල් පණිවිඩය යොමුකරන ලද දිනයත් අතර සතියකට ආසන්න ප්‍රමාදයක් නිරීක්ෂණය විය.

(ඔ) අඩුපාඩු සහිත අයදුම්පත් සඳහා බාහිර සනාථකිරීම් ලබාගැනීමට අවශ්‍ය අවස්ථාවන්හි දී පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව වැනි රාජ්‍ය ආයතන සඳහා විදේශදූත මණ්ඩල අංශය විසින් අදාළ ආයතන වෙත ලිපියොමුකර තිබුණ ද, ඊට අදාළ ප්‍රතිචාරයන් ලැබී නොමැති අවස්ථාවන්හි දී ඒ සඳහා පසුවිපරම් කටයුතු කිසිවක් සිදුකර නොතිබුණි.

(ඕ) 2025 ජනවාරි සිට මාර්තු දක්වා විදේශදූත මණ්ඩල හරහා ලද විදේශ ගමන් බලපත්‍ර නිකුත්කිරීම සම්බන්ධයෙන් පරිගණකගත පද්ධතිය හරහා සිදුකරනු ලැබූ නියැදි විගණන පරීක්ෂාවේ දී විදේශ ගමන් බලපත්‍ර නිකුත් කිරීමට මාස 03 සිට මාස 12 දක්වා වූ ප්‍රමාදයක් නිරීක්ෂණය විය.

(ක) චීන රජයේ අනුග්‍රහය සහිතව “Seminar on Peacekeeping Capacity Building for Sri Lanka in China” නමින් විදේශ පුහුණු වැඩසටහනක් සඳහා නිලධාරීන් සහභාගී කරවීමට චීන රජය විසින් 2025 ජූලි 18 දින දෙපාර්තමේන්තුව වෙත විද්‍යුත් පණිවිඩයක් යොමුකර තිබූ අතර, එකී පුහුණුවේ විද්‍යුත් පණිවිඩයේ විෂයය (subject) යටතේ “Invitation for Investigation Officers of Department of Immigration and Emigration” යනුවෙන් සඳහන් කරමින් දෙපාර්තමේන්තුවේ විමර්ශන කටයුතුවලට වඩාත් යෝග්‍ය හා උපකාරී වන විෂයය අන්තර්ගතයන් සහිතව යොමුකර තිබුණු නමුත් ඒ සඳහා බලයලත් නිලධාරීන් (Investigation Officers) සඳහා වැඩි ප්‍රමුඛතාවයක් ලබාදීම වෙනුවට පරිපාලන සේවයේ නිලධාරීන් 4දෙනෙක් හා ගණකාධිකාරී සේවයේ නිලධාරිනියක් සඳහා ප්‍රමුඛතාවය ලබා දී තිබුණි.

(ඛ) 2025 ජූලි 14 දිනැති අංක 18/2025 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 04.2 ප්‍රකාරව අමතර ප්‍රතිලාභ ලබන සේවා ස්ථානයක වසර 03ක් වන උපරිම සේවාකාලය සම්පූර්ණකර ඇති නිලධාරීන් අනිවාර්යයෙන්ම ස්ථාන මාරුවීම් සඳහා යටත් වන අතර, විදේශ පුහුණුවීම සඳහා සහභාගී වූ නිලධාරීන් 08දෙනාගෙන් පරිපාලන සේවයේ නිලධාරීන් තිදෙනෙකු දෙපාර්තමේන්තුවට අදාළව වසර 03ක උපරිම සේවාකාලය පුහුණු වැඩසටහන ආරම්භක දින වන විටත් අවසන්කර තිබූ අතර, විගණන දිනය වූ 2025 දෙසැම්බර් 12 වන විට ඉන් එක් නිලධාරියෙකු ස්ථානමාරුවීම් ද ලබා දෙපාර්තමේන්තුවෙන් වෙනත් රාජ්‍ය ආයතනයක් වෙත මාරු වී තිබුණි.

10

(ග) සීමිත නිලධාරීන් පිරිසකට පමණක් ආරාධනා ලද ඉදිරියේ දී ඉහළ ප්‍රතිලාභ දෙපාර්තමේන්තුව වෙත ලබාගත හැකි පුහුණු වැඩසටහන සඳහා වඩාත් යෝග්‍ය නිලධාරීන් තෝරාගැනීමේ දී, විධායක කමිටුවක් තුළින් තෝරාගැනීමේ නිර්ණායක ඇතුළත්ව විනිවිදභාවයකින් යුතු තෝරාගැනීමේ ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමකින් තොරව නිලධාරි අභිමතය මත පදනම්ව පුහුණුව සඳහා අදාළ නිලධාරීන් තෝරා පත්කර ගෙන තිබුණි.

(ඝ) සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට මියගිය නිලධාරියෙකුගෙන් වසර 5කට වැඩි කාලයක සිට අයවිය යුතු ආපදා ණයශේෂය රු.42,757ක්, විශ්‍රාම ගිය නිලධාරීන් 6 දෙනෙකුගෙන් අයවිය යුතු ආපදා ණයශේෂය රු.967,190ක්, 2021 වර්ෂයේ දී වැඩතහනම් කළ නිලධාරියෙකුගෙන් අයවිය යුතු ආපදා ණයශේෂය රු.179,628ක් හා සේවය අතහැර ගොස් ඇති නිලධාරීන්ගෙන් අයවිය යුතු ණයශේෂ ලෙස වසර 10 සිට 20 දක්වා නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.72,496ක් ද, වසර 5 සිට 10 දක්වා නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.57,678ක් සහ වසර 1 සිට 3 දක්වා නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.231,500ක් වන ආපදා ණයශේෂ සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අයකර ගැනීමට නොහැකි වී තිබුණි.

කේ. කේ. එස්. ජයකොඩි
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

11

ආගමන හා විගමන දෙපාර්තමේන්තුව
குடிவரவு மற்றும் குடியகல்வுத் திணைக்களம்
Department of Immigration and Emigration